**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**

වාර්ෂික වාර්තාව 2014

# ගමන් මගෙහි සෑම පියවරකදීම ජීවිත සාරවත් කරමින්...



# පටුන


අපගේ දැක්ම / අපගේ මෙහෙවර /අපගේ ඉලක්ක / අපගේ වටිනාකම් 02

සාංගමික තොරතුරු 03

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය 04

මං සලකුණු 05

අපගේ ලොතරැයි 06

සභාපතිතුමන්ගේ සමාලෝචනය 09

අධ්‍යක්‍ෂ මණ්ඩලය 11

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සමාලෝචනය 12

කළමනාකරණ කණ්ඩායම (වර්තමාන) 13

මෙහෙයුම් සමාලෝචනය 14

තිරසාරත්වය පිළිබඳ වාර්තාව 19

සාමූහික පාලනය 25

අවදානම් කළමනාකරණ වාර්තාව 27

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 29

ස්වාධීන විගණකගේ වාර්තාව 31

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 44

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 45

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 46

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය 47

මුදල් ප්‍රකාශ සම්බන්ධ සටහන් 48

දස අවුරුදු සාරාංශය 67

# ගමන් මගෙහි සෑම පියවරකදීම ජීවිත සාරවත් කරමින්...

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වසර 32 කට වැඩි කාලයක් තිස්සේ ශ්‍රී ලාංකික ජනතාවට ධනයෙන් දායක වී ඇත. ශනිදා වාසනාව, සංවර්ධන වාසනාව, ජයෝදා, ජන ජය, නියත ජය හා සුපර් බෝල් නම් වූ අපගේ නිෂ්පාදනවල වල ආධාරයෙන් අපට හවුල් වූ සෑම පාරිභෝගිකයෙකුටම, ව්‍යාපාර හවුල්කරුවෙකුටම, සැපයුම්කරුවෙකුටම සහ කොටස්කරුවෙකුටම විශිෂ්ඨත්වය හා වටිනාකම් නිර්මාණය කිරීමට හැකිවීමත් සමඟ නිෂ්පාදිත කලඹ ස්ථාවරව වර්ධනය වී ඇත.

ගමන් මගෙහි සෑම පියවරකදීම ජීවිත සෘජුවම හා වක්‍රව සාරවත් කරමින් දහස් ගණනක් ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත උසස් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ වටිනාකම් එකතු කර ගැනීමට අවස්ථා සොයමින් අද වන විට අප විශාල ලෙස වර්ධනය වෙමින් සිටී.

## අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව නිර්මාණය කරන පොදු ඒකකය වීම.

## අපගේ මෙහෙවර

"ඉහළ තාක්ෂණය උපයෝගී කරගනිමින්, විශ්වාසනීයත්වය ආරක්ෂා කරමින්, සියලුම අවස්ථාවලදී පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් විශිෂ්ට අන්දමින් ඉටුකරමින් නව නිර්මාණාත්මක හා ආකර්ෂණීය ලොතරැයි පැවැත්වීම"

## අපගේ ඉලක්ක

වෙළෙඳපොළ කොටස වැඩි කර ගැනීම.

ජනාධිපති අරමුදලට ලබාදෙන දායකත්වය උපරිම කිරීම.

නව තාක්ෂණය ඵලදායීව ලබාගැනීම හා උපයෝගී කර ගැනීම.

පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම.

## අපගේ වටිනාකම්

**අවංකභාවය**

අප ඉදිරිපත් කරන ලොතරැයි හා අප ව්‍යාපාරික කටයුතු වල යෙදෙන ආකාරය සාධාරණයි, අවංකයි, විශ්වාසනීයයි.

**ධනාත්මක ආකල්ප**

ලොතරැයි ව්‍යාපාරයේ යෙදී සිටින අතරතුර මුහුණ පාන්නට සිදුවන සෑම අභියෝගයක් සඳහාම සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයනට ශුභවාදී ප්‍රවේශයක් ඇත.

**ප්‍රතිඵල කරා නැඹුරුව**

සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයෝ සිය කාර්යභාරය පිළිබඳ දැඩි විශ්වාසයකින් කටයුතු කරන අතර නියමිත ඉලක්කයන් කාර්යක්ෂම ආකාරයෙන් සපුරාලීම කෙරෙහි අවධානය යොමු කරයි.

**නවෝත්පාදනය**

ව්‍යාපාරික කටයුතු වැඩි දියුණු කරන අදහස් සොයා බැලීමට සහ වෙළෙඳපොළෙහි සිදුවන උපායමාර්ගික හා තරඟකාරී වෙනස්කම් වලදී තීරණ ගෙන ඉක්මනින් ක්‍රියා කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයන් ධෛර්යමත් කරනු ලැබේ.

**කණ්ඩායම් වැඩ**

විවෘතභාවය, අන්‍යෝන්‍ය ගරුකිරීම හා පුද්ගල සංවර්ධනය ප්‍රවර්ධනය කරන අතරතුර සංවිධානයේ ඉලක්ක සපුරාලීම උදෙසා සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයෝ එකමුතුව කටයුතු කරති.

**විශිෂ්ඨත්වය කරා නඹුරු වීම**

සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයෝ සිය සේවාවන්හි ගුණාත්මකභාවය උපරිම තත්ත්වයට පත් කිරීමට අඛණ්ඩව දැඩි ප්‍රයත්නයක් දරති.

# සාංගමික තොරතුරු

**මණ්ඩලයේ නම**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**නෛතිකභාවය**

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාපන කර ඇත.

**ආරම්භ කළ දිනය**

1983 ජනවාරි මස 19 වන දින

**ලියාපදිංචි කාර්යාලය**

නො. 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02.

**දුරකථන**

011 2 333456/8, 011 4 824 824

**ෆැක්ස්**

011 2 333 545

**විද්‍යුත් තැපෑල**

devlottr@slt.lk

**වෙබ් අඩවිය**

www.dlb.lk

**TIN**

409089844

**අධ්‍යක්ෂ මණ්ඩලය (2014)**

01. වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ - සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
02. නීතිඥ ගාමිණී ඒකනායක මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
03. ඩී. එන් නානායක්කාර මහතා - අධ්‍යක්ෂ
04. රංජිත් තේනුවර මහතා - අධ්‍යක්ෂ
05. ආර්. කේ ජයලත් මහතා - අධ්‍යක්ෂ

**විගණක**

විගණකාධිපති

**අභ්‍යන්තර විගණක (2014)**

සුදර්ශන පුෂ්පකුමාර සහ සමාගම, වරලත් ගණකාධිකාරිවරු

**බැංකුකරුවන්**

මහජන බැංකුව

ලංකා බැංකුව

සම්පත් බැංකුව

ශාඛා කාර්යාල

**කුරුණෑගල**

නො.121, නුවර පාර, කුරුණෑගල

දුරකතන/ෆැක්ස් : 037 2 233 560, 037 4 641 002

**මාතර**

නො. 42/1, ධර්මපාල මාවත, මාතර

දුරකතන/ෆැක්ස් : 041 2 234 664

**මොණරාගල**

නව බස්නැවතුම්පොල, මොණරාගල

දුරකතන/ෆැක්ස් : 055 4 498 028

# සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය

ආරම්භයේදී "සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය" ලෙස හඳුන්වනු ලැබූ සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1983 ජනවාරි 19 වැනි ද පිහිටවනු ලැබූ අතර, මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන පරමාර්ථය වූයේ අරමුදල් එක් රැස් කිරීමට රජයට පූර්ණ සහය දැක්වීමයි.

ඉන්පසුව සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය "සංවර්ධන ලොතරැයි භාරය" නම් වූ භාරයක් බවට 1993 දී පත් කරන ලදී. 1997 අගෝස්තු 12 වැනිද 1997 හි අංක 20 දරණ සංවර්ධන ලොතරැයි පනත මගින් මෙම භාරය සංවර්ධන ලොතරැයි මණ්ඩලය බවට පරිවර්තනය කරන ලදී.

1983 වර්ෂයේදී ක්ෂණික දිනුම් හිමි කර දෙන ලොතරැයි පත් හඳුන්වා දෙමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙළෙඳපොලට පිවිසුන අතර 1987 දී "ශනිදා වාසනා" ටිකට්පත දියත් කිරීමත් සමඟම ලොතරැයි වෙළෙඳපොලට රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම හඳුන්වා දුන් ප්‍රථම ලොතරැයි සංවිධානය බවට පත්විය. මුලදී දිනුම් ඇදීම සෙනසුරාදා දින පමණක් පැවත්වූ නමුත් එය බදාදා දිනටද ව්‍යාප්ත කරන ලදී.

"වාසනා චක්‍රය" රූපවාහිනී දිනුම් ඇදීමේ දෙවන අදියර 1998 ජනවාරි 25 වැනිදා ඇරඹුන අතර එය සෑම ඉරු දිනකම පවත්වන ලදී. මෙය ත්‍යාග හිමිකර නොගන්නා සූරන ක්‍රමයේ ලොතරැයි පත් සඳහා මැනවින් සකස් කරන ලද්දකි. මෙම වැඩසටහනට මහජනයාගෙන් ඉහළ ප්‍රතිචාරයක් ලැබුණි. "සංවර්ධන වාසනාව" නම් වූ දෙවැනි රූපවාහිනි දිනුම් ඇදීම 1998 ඔක්තෝබර් 09 වෙනි දින ආරම්භ වුණි. අඟහරුවාදා සහ සිකුරාදා දිනයන්හිදී මෙම දිනුම් ඇදීම පවත්වන ලදී. ජයග්‍රාහකයින් හඳුනාගැනීම සඳහා අංක සමග ලග්න සංකේත හඳුන්වා දීම මෙම ටිකට් පතෙහි අනන්‍ය ලක්ෂණයක් විය.

සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනයන්හිදී දිනුම් අදින "ජයෝදා" ටිකට්පත හඳුන්වා දීමටද අපට 2004 ජනවාරි 26 වෙනි දින හැකියාව ලැබුණි. සම්මත මහා දිනුමට හා නිත්‍ය මුදල් ත්‍යාග වලට අමතරව සුපිරි මහා දිනුමක් මෙම ටිකට් පත් මගින් පිරිනමයි. සුපිරි මහා දිනුම ඇරඹෙන්නේ රුපියල් මිලියන 10 ක මුදලකිනි. ශ්‍රී ලංකා ලොතරැයි ඉතිහාසයේ පළමු වරට නිත්‍ය මහා දිනුම් ලබන ජයග්‍රාහකයින්ට රුපියල් මිලියන 01 ක මුදල් ත්‍යාගයක් හෝ රුපියල් මිලියන 01 කට අධික වටිනාකමක් ඇති නිවසක් හෝ තෝරාගැනීමේ හිමිකමක් තිබුණි.

බ්‍රහස්පතින්දා හා සෙනසුරාදා දිනයන්හිදී දිනුම් අදින "ජන ජය" ලොතරැයිය 2009 අප්‍රේල් 10 වන දින දියත් කිරීමේ හැකියාව සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ලැබුණි. සුපිරි ත්‍යාගය දිනා ගැනීම සඳහා එම වාසනාවන්තයා අංක 64 ක් අතරින් අංක 04 ක්ද, තවත් යන්ත්‍රයක් තුළින් අංක 12 ක් අතරින් සුපිරි අංකයක්ද ගැලපිය යුතුය. සුපිරි මහා ත්‍යාගය ආරම්භවන්නේ රුපියල් මිලියන 2.5 ක මුදලකිනි.

2012 ජූලි 11 වන දින "සුපර් බෝල් " ලොතරැයිය හඳුන්වා දීමත් සමග ලොතරැයි කර්මාන්ත ඉතිහාසයේ විශිෂ්ඨ සංධිස්ථානයක් සනිටුහන් කිරීමට හැකියාව ලැබිණි. මෙතෙක් විශාලම ත්‍යාග මුදල වූ රුපියල් මිලියන 30 ජයමල්ල සමඟ ඉහළ පොදු ජනතා ආකර්ෂණයක් දිනා ගැනීමට හැකියාව ලැබිණි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් උපයනු ලබන ලාභය සමස්ථ රටෙහිම අභිවෘද්ධිය වෙනුවෙන් ජනාධිපති අරමුදලට බැර කරනු ලැබේ. ඉන් හරි අඩක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදලට බැර වේ. ඉතිරියෙන් සමස්ථ ප්‍රජාවගේ අනාගතය යහපත් කිරීම පිණිස දිළිඳු ජනයාගේ ජීවන තත්ත්වය නගා සිටුවීම, සෞඛ්‍ය අවශ්‍යතා සපයා දීම, ආගමික ස්ථාන නඩත්තුව, සුභසාධන සංගම් වලට උපකාර කිරීම සහ ක්‍රීඩාව හා කලාව දියුණු කිරීම වැනි කටයුතු සඳහා යෙදවීමට පියවර ගන්නා ලදී.

# මං සලකුණු

**1987**

"ශනිදා වාසනාව" නම් ප්‍රථම රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම ආරම්භ කිරීම.

**1993**

"සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය" "සංවර්ධන ලොතරැයි භාරය" බවට පරිවර්තනය කිරීම.

**1997**

1997 හි අංක 20 දරණ සංවර්ධන ලොතරැයි පනත මඟින් රජයට අයිති සංස්ථාවක් ලෙස "සංවර්ධන ලොතරැයි භාරය" "සංවර්ධන ලොතරැයි මණ්ඩලය" බවට පරිවර්තනය කරන ලදී.

- රුපියල් බිලියන 02 හි විකුණුම් පිරිවැටුමට ළඟාවීම.

**1998**

ජයග්‍රහණය නොකළ සූරන ටිකට්පත් වෙනුවෙන් "වාසනා චක්‍රය" රූපවාහිනී දිනුම් ඇදීම හඳුන්වා දීම. "වින්ඩෝස්" ක්ෂණික ලොතරැයි පත සහ ජයග්‍රාහී ත්‍යාගය ලෙස සුඛෝපභෝගී මොටර් රථයක් හිමිවන රු.100 "යුරේකා" ක්ෂණික ලොතරැයි පත සමඟ "සංවර්ධන වාසනාව" ලොතරැයි පත හඳුන්වා දීම.

**1999**

ලෝක බැංකුවේ සහයෝගය ඇතිව Y2K ගැටළුවට මුහුණ දීම සඳහා පරිගණක පද්ධති යාවත්කාලීන කිරීම.

**2004**

මුදල් ත්‍යාගයක් හෝ වටිනා නිවසක් ත්‍යාග ලෙස පිරිනමන "ජයෝදා" ටිකට්පත හඳුන්වා දීම.

- රුපියල් බිලියන 03 හි විකුණුම් පිරිවැටුමට ළඟාවීම.

**2008**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හිමිකාරීත්වය ඇති නො. 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 02 හි නව ගොඩනැගිල්ලට පිවිසීම.

- රුපියල් බිලියන 05 හි විකුණුම් පිරිවැටුමට ළඟාවීම.

**2010**

සුපිරි ජයමල්ලක ත්‍යාගයක් සමඟ "ජන ජය" ලොතරැයි පත හඳුන්වාදීම.

**2011**

"නියත ජය" ලොතරැයි පත හඳුන්වාදීම.

**2012**

ඉතිහාසයේ විශාලම ත්‍යාග මුදල වූ රුපියල් කෝටි 03 ජයමල්ලක් සමඟ "සුපර් බෝල්" ලොතරැයි පත හඳුන්වාදීම.

**2013**

විශාල ජයමල්ලක් සමඟ "හයිවේ ඩ්‍රීම්" ලොතරැයි පත හඳුන්වාදීම.

**2014**

කෙටි පණිවිඩ (SMS) මගින් ලොතරැයි අලෙවිය ආරම්භ කිරීම.

# අපගේ ලොතරැයි



සංවර්ධන වාසනාව
01 02 03 04
සංවර්ධන වාසනාව
01 02 03 04
1759
සංවර්ධන වාසනාව
ජනජය
JANAJAYA
12
5 35 46 62
20/-
ජනජය
JANAJAYA
C
5 35 46 62
20/-
20/-
ජයෝදා
U 09 47 49
20/-
ජයෝදා
U 09 47 49 20
02.10.2014



ශනිදා
වාසනාව
ශනිදා
වාසනාව
D 02 04 05 32
D 02 04 05 32
Ministry of Finance and Planning
SUPER
BALL
H 11 22 23 59
2012-07-23
001
E 5 35 46 62
2012-07-23
001
20/-
E 5 35 46 62
2012-07-23
001
20/-


02
05
07
M
කළමනාකරණ
වාර්තාව

# සභාපතිතුමන්ගේ සමාලෝචනය

**"ජනාධිපති අරමුදලට දායකවීමෙන් පමණක් නොව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු හරහා රටපුරා උත්පාදනය වන සෘජු හා වක්‍ර රැකියා අවස්ථා මගින්ද සංවර්ධන ලොතරැයි මණ්ඩලයට සමාජීය සංවර්ධනය සඳහා සහයෝගය ලබාදීමට හැකියාව ලැබී ඇතැයි මම විශ්වාස කරමි"**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා ලෙස 2015 පෙබරවාරි මාසයේදී වගකීම භාරගැනීමත් සමඟ 2014 මූල්‍ය වර්ෂයට අදාලව මණ්ඩලයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම ඉමහත් සතුටට පත්වෙමි. මාගේ හැකියාව පිළිබඳ විශ්වාසය තබා සංවර්ධන ලොතරැයි මණ්ඩලයට නායකත්වය සැපයීම සඳහා මා තෝරාගැනීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට සහ රජයට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. එසේම සංවර්ධන ලොතරැයි මණ්ඩලයට කළ සේවය වෙනුවෙන් හිටපු සභාපතිතුමන්ටද මාගේ ස්තූතිය පුද කරමි.

ජනාධිපති අරමුදල සඳහා අරමුදල් යොමු කිරීම තුළින් ජාතික සංවර්ධනයට සහයෝගය දැක්වීම නම් වූ අපගේ මුඛ්‍ය පරමාර්ථය හරහා දශක තුනක් තිස්සේ රටෙහි ජනතාවට සංවර්ධන ලොතරැයි මණ්ඩලය විශාල සේවාවක් සපයා ඇත. ඉහළ දායකත්වයක් සහතික කිරීම තුළින් ඉදිරියේදී ද මෙම වෑයමට නොමඳ සහයෝගයක් දැක්වීමට මම බලාපොරොත්තු වෙමි. ජනාධිපති අරමුදලට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දායකත්වය වර්ධනය කළ හැකි මට්ටමේ ඉහළ ලාභදායිත්වයක් සමඟ සලකා බලන වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයට විශිෂ්ට කාර්යසාධනයක් වාර්තා කිරීමට ලැබීම පිළිබඳ මා සතුටට පත්වෙමි.

වර්ෂය අවසාන වන විට සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. මිලියන 9,719 ක ආදායමක් වාර්තා කළ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව තරමක අඩුවීමකි. නමුත් මෙම ආදායමෙහි අඩුවීමට ප්‍රධාන හේතුව ලෙස රටෙහි විවිධ පාරිභෝගික කණ්ඩායම් වල වැය කළ හැකි ආදායමේ අඩුවීම හඳුනාගත හැකිය. ලොතරැයි ක්ෂේත්‍රයේ තරඟකාරීත්වය සමඟ වාසනාව හා බැඳි ක්‍රීඩා සහ ලොතරැයි සඳහා පවතින අනෙකුත් අවස්ථා වල පවතින තරඟකාරිත්වයද විකුණුම් කෙරෙහි සෘණාත්මකව බලපාන ලදී.

කෙසේ වෙතත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි වලට පවතින ශක්තිමත් ඉල්ලුමෙන් නිරූපණය වනුයේ ශ්‍රී ලාංකීය ප්‍රජාව තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි කෙරෙහි

# සභාපතිතුමන්ගේ සමාලෝචනය

ඇති දැඩි විශ්වාසනීයත්වය හා කීර්තිමත්භාවයයි. ආදායමේ යම් අඩුවීමක් පැවතියද පසුගිය මූල්‍ය වර්ෂයේදී රු. මිලියන 2,195 ක් වූ බදු පෙර ලාභය 10% කින් වර්ධනය වී රු. මිලියන 2,422 ක් වාර්තා කිරීමට හැකිවීම පිළිබඳ මා ප්‍රකාශ කරන්නේ ඉමහත් සතුටිනි. වර්ෂය පුරා පවත්වාගත් ඉහළ කාර්යක්ෂමතාවය හා පිරිවැය ඉතිරිය මඟින් වූ මෙහෙයුම් උසස් වීම් වල බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස මෙම මෙහෙයුම් ලාභයේ වර්ධනීය තත්ත්වය හඳුනාගත හැකිය. මානව සම්පත් සංවර්ධන, කාර්යසාධන උසස් වීම් හා මූල්‍ය විශ්වාසනීයභාවය කෙරෙහි අවධානය යොමුකරන අතරතුර අභ්‍යන්තර පද්ධති හා ක්‍රමවේද උසස් කිරීමට මම බලාපොරොත්තු වන අතර, මෙහෙයුම් හා මූල්‍ය විශ්වාසනීයත්වය පවත්වාගෙන යාම, නිවැරදි ක්‍රමවේද පිළිපැදීම, අභ්‍යන්තර පද්ධති වල උසස් වීම තුළින් ජනතාවට වඩාත් හොඳ නිෂ්පාදිත ලබාදීම හා වැඩි වශයෙන්ම පාරිභෝගිකයා කේන්ද්‍රකරගත් සේවා තුළින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වටිනාකම ඉහළ නැංවෙන බව මා විශ්වාස කරන අතර එමඟින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මුඛ්‍ය අරමුණ ශක්තිමත් වනු ඇත. මෙම කාර්‍යයන් වල උසස් වීම් වල උපකාරයෙන් පසුගිය වර්ෂයේ රු. මිලියන 2,026 ක් වූ ජනාධිපති අරමුදලට දායකත්වය රු. මිලියන 2068 ක් දක්වා 2% කින් වර්ධනය කරගැනීමට මෙම වර්ෂයේදී අපට හැකියාව ලැබුණි. සමාජයේ ඉහළ ප්‍රමුඛතාවක් ඇති අවශ්‍යතාවන් සඳහා අරමුදල් ලබාදෙන ජනාධිපති අරමුදලට අරමුදල් එක්රැස් කිරීම සඳහා වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යවස්ථාපිත පරමාර්ථය සම්පූර්ණ කිරීමට හැකිවීම සැබැවින්ම ප්‍රශංසනීය ජයග්‍රහණයකි. ඊට අමතරව වර්ෂය තුළදී ලොතරැයි ජයග්‍රහණ සඳහා රු. මිලියන 6,211 ක් බෙදාහරින ලද අතර ඒ තුළින් එම පවුල් වල ආර්ථික අභිවෘද්ධියට සෘජුවම දායකවන ලදී.

## සමාජ දායකත්වය

ජනාධිපති අරමුදලට දායකවීමෙන් පමණක් නොව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු හරහා රට පුරා උත්පාදනය වන සෘජු හා වක්‍ර රැකියා අවස්ථා මඟින්ද සංවර්ධන ලොතරැයි මණ්ඩලයට සාමාජීය සංවර්ධනය සඳහා සහයෝගය ලබාදීමට හැකියාව ලැබී ඇතැයි මම විශ්වාස කරමි. බෙදාහරින්නන් 72 ක්, නියෝජිතයින් 2,196 ක් හා 20,000 ක පමණ අලෙවි සහායකයින්ගෙන් සැදුම් ලත් බෙදාහැරීම් ජාලය සමාජයේ අඩු ආදායම් ලබන පිරිස් වලට රැකියා අවස්ථා නිර්මාණය කර ඇති අතර ඒ තුළින් ඔවුන්ගේ පවුල් වල නිතිපතා සාමාන්‍ය ආදායමක් සහතික කොට ඇත. ඊට අමතරව මහජන සුභසාධනය ඉලක්ක කරගත් බොහොමයක් පුණ්‍ය කටයුතු වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය සෘජුවම දායකත්වය ලබා දී ඇති අතර අවශ්‍යතාවය මත හැකි සෑම අවස්ථාවකදීම සහයෝගය ලබාදී ඇත. ඒ අතරවාරයේ කලානුරූපී හා බාධාවක් නොමැති සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි දිනුම් ගෙවීම් මගින් ද එම පවුල් වල ජීවන තත්ත්වය උසස් කිරීමට දායක වී ඇත.

## ඇගයීම

සමාජීය තත්ත්වයන් උසස් කිරීම් නියෝජිතයකු නිර්මාණය කිරීමට දායක වූ සියලුම පාර්ශවකරුවන් වෙත ආමන්ත්‍රණය කිරීමට මා තුළ දැඩි කැමැත්තක් ඇත. එසේම පසුගිය මූල්‍ය වර්ෂය තුළ දැක්වූ දායකත්වය සඳහා හිටපු සභාපති වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ මැතිතුමන්ටද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වූ නිතිඥ ගාමිණී ඒකනායක, ඩී. එන් නානායක්කාර, රංජිත් තේනුවර හා ආර්. කේ. ජයලත් යන මහත්වරුන්ටද මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි. එසේම ලබා දෙන නිවැරදි මාර්ගෝපදේශකත්වය සඳහා මුදල් අමාත්‍යංශයට මාගේ ප්‍රණාමය පුද කරනු ලබන අතර සෑම අවස්ථාවකදීම ජනාධිපති අරමුදල හා මහපොළ භාර අරමුදල ලබාදෙන උපකාර හා සහයෝගය වෙනුවෙන් මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සාර්ථකත්වය පිටුපස ප්‍රබලම සාධකය වන එහි සේවක මණ්ඩලයට ද වර්ෂය තුළ සිදුකළ දැවැන්ත කැපකිරීම් වෙනුවෙන් මාගේ හද පිරි ස්තූතිය ප්‍රකාශ කරමි. එසේම බෙදාහැරීම් ජාලය හා පාරිභෝගිකයින් ඇතුළු සියලුම පාර්ශවකරුවන්ට මාගේ ප්‍රණාමය පුද කරමි.

**දයා පැල්පොල**
සභාපති

05

# අධ්‍යක්‍ෂ මණ්ඩලය

### අධ්‍යක්‍ෂ මණ්ඩලය (2014)

01. වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ - සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
02. ගාමිණී ඒකනායක මහතා - ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ (නීතිඥ)
03. ඩී. එන් නානායක්කාර මහතා - අධ්‍යක්‍ෂ
04. රංජිත් තේනුවර මහතා - අධ්‍යක්‍ෂ
05. ආර්. කේ ජයලත් මහතා - අධ්‍යක්‍ෂ

### අධ්‍යක්‍ෂ මණ්ඩලය (වර්තමාන)

01. දයා පැල්පොල මහතා - සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
02. ආර්.අයි විමලසේන මහත්මිය - උප සභාපති
03. වික්‍රම වීරසූරිය මහතා - අධ්‍යක්‍ෂ
04. ඩී. එන් නානායක්කාර මහතා - අධ්‍යක්‍ෂ
05. එම්.එස්.ඩී රණසිරි මහතා - අධ්‍යක්‍ෂ

# අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සමාලෝචනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2014 වාර්ෂික වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වනුයේ ලොතරැයි පැවැත්වීමෙන් උපයනු ලබන අතිරික්ත මුදල ජනාධිපති අරමුදලට හා ඒ හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ලබාදීමයි. 2014 වසර තුළ විශාල අලෙවි ආදායමක් ලබා ගැනීමෙන් විශාල ත්‍යාග මුදල් ප්‍රමාණයක් අපගේ ගනුදෙනුකරුවන් වෙත ලබා දීමෙන් ද වාර්තාගත වැඩිම මුදලක් වන රුපියල් මිලියන 2068 ක් ජනාධිපති අරමුදල වෙත ලබා දීමෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රගතිය මනාව පැහැදිළි වේ.

2014 වසර තුළ අපගේ ගනුදෙනුකරුවන් තෘප්තිමත් වන ආකාරයේ ලොතරැයිපත් වෙළඳ පොළට හඳුන්වාදීමටත්, ආකර්ෂණීය ත්‍යාග රටාවන් හඳුන්වා දීම තුළින් අලෙවි ප්‍රවර්ධනයක් ඇති කිරීමටත්, ලොතරැයි බෙදා හැරීමේ අලෙවි නියෝජිත හා අලෙවි නියෝජිත වැඩමුළු පවත්වා ඔවුන්ගේ අලෙවි ප්‍රවර්ධනයෙහි ගැටලු හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් ලබා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හැකිවිය.

ගනුදෙනු කරුවන්ට මූල්‍ය ත්‍යාග ලබාදීමෙන් ඔවුන්ගේ ආර්ථික ශක්තිය නංවාලීම ද, අලෙවි නියෝජිතයන්ට ප්‍රතිදාන ලබා දෙමින් ද, සෞඛ්‍ය ක්ෂේත්‍රය හා උසස් අධ්‍යාපන කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිදාන කිරීම තුළින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය රාජ්‍ය ආයතනයක් ලෙස ඉතා විශිෂ්ට සේවාවක් ඉටු කර ඇති බව ද සඳහන් කරමු.

ශ්‍රී ලංකාවේ සාමකාමී පරිසරයක් ඇතිවීම තුළ දිස්ත්‍රික්ක 25 තුළම ලොතරැයිපත් අලෙවි කිරීමට හැකිවීම අප ලද තවත් ජයග්‍රහණයකි.

2014 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම හා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම තුළින් මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පරිපාලන කටයුතු හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වඩාත් ඵලදායි ව හා කාර්යක්ෂම ව පවත්වා ගැනීමට හැකි විය. එමෙන්ම සමස්ථ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය, උනන්දුව හා කැපවීම නිසාත්, විගණකවරුවන්ගේ මඟ පෙන්වීම නිසාත් ඉහළ ඵලදායිතාවක් ලබා ගැනීමට හැකි වූ වසරකි. එමෙන්ම සියළු දෙනාගේම උත්සාහය හා කැපවීම තුළ ලබන වසරේ නව තවත් ජයග්‍රහණ ඇති කර ගනිමින් ලබන වසර මීටත් වඩා සාර්ථක වසරක් බවට පත් කර ගැනීම අපගේ ඒකායන අභිමතාර්ථයයි.

**ඩී. එන්. නානායක්කාර**
අධ්‍යක්ෂ

# කළමනාකරණ කණ්ඩායම (වර්තමාන)

**ජේ. එම්.  සමන් ජයසිංහ මහතා**
සාමාන්‍යාධිකාරි

**අනුර ජයරත්න මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි)

**විජිතා සෝමරත්න මෙනවිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය)

**චානක දොඩංගොඩගේ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරි (අලෙවි)

**කපිල බුලත්සිංහල මහතා**
සහකාර සාමාන්‍යාධිකාරි (අලෙවි)

**සුනිල් ජයරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය)

**කසුන් ජයසූරිය මහතා**
සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය)

**නිශාන් පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය)

**නුවන් අබේරත්න මහතා**
පරිපාලන නිලධාරි

**මේජර් ජේ. එම්. ඩී. ඒ ක්‍රිෂාන්ත මහතා**
ප්‍රධාන ආරක්ෂක නිලධාරි

# මෙහෙයුම් සමාලෝචනය

සමාජ සුභසාධනය සඳහා රජයට අවශ්‍ය අරමුදල් උත්පාදනය කිරීමට සහයෝගය ලබාගැනීම සඳහා 1983 ජනවාරි මස 19 වන දින සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ථාපනය කරන ලදී. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ව්‍යවස්ථාපිත නියෝගයන්ට අනුව එහි ආදායම ජනාධිපති අරමුදලට බැර කරනු ලැබේ. එම අරමුදල් වලින් 50% ක ප්‍රමාණයක් භාවිතා කරනුයේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහාය. ප්‍රේෂණය කරනු ලබන අරමුදල් වලින් දුප්පත් ප්‍රජාව සඳහා විවිධ මූල්‍ය සහනාධාර වැඩසටහන් හරහා සමාජය තුළට ප්‍රති ආයෝජනය කරනු ලබයි.

## ගෝලීය ලොතරැයි කර්මාන්තය - 2014

ලෝක ලොතරැයි සංවිධානයට අනුව 2013 වර්ෂයේදී සටහන් කළ 4.9% ක වසරින් වසර ගෝලීය ලොතරැයි අලෙවි වර්ධනය තවදුරටත් ශක්තිමත් කරමින් 2014 වර්ෂයේදී 9.9% ක අලෙවි වර්ධනයක් සනිටුහන් කරන ලදී. නැවත වරක් ආසියා පැසිපික් සහ ලතින් ඇමරිකා කලාපීය රටවල ශක්තිමත් කාර්යසාධන පදනම මත ලොව පුරා ලොතරැයි අලෙවි වර්ධනය ගොඩනැගෙන ලදී. එම කලාප දෙකෙහිම රටවල් අඛණ්ඩව පසුගිය කාර්තු 06 තුළ ඉලක්කම් දෙකෙහි වාර්තාගත අලෙවි වර්ධනයක් සනිටුහන් කරන ලදී. ආසියා පැසිපික් සහ ලතින් ඇමරිකානු වෙළෙඳපොලවල් ශක්තිමත් කාර්යසාධන තත්ත්වයන්ගෙන් පන්නරය ලැබූවද උතුරු ඇමරිකානු කලාපය තුළ 2014 වර්ෂයේදී අලෙවිය තරමක මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2014 වර්ෂයේදී යුරෝපීය හා අප්‍රිකානු වෙළෙඳපළවල් ඔවුන්ගේ කොටස තුළ තරමක මධ්‍යස්ථ වර්ෂයෙන් වර්ෂය ප්‍රතිලාභයන් වාර්තා කරන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ මෑතකලීන ආර්ථික වර්ධනීය ප්‍රවනතාවයන් සමඟ 2014 වර්ෂයේ ගෝලීය අලෙවි වර්ධනීය තත්ත්වයන් නිසා පසුගිය වසර 02 කට සාපේක්ෂව ගෝලීය වර්ධනය වඩාත් විශ්වාසනීය අදියරකට පැමිණ ඇත.

**2010- 2014 ගෝලීය වර්ධනය**




ආසියානු පැසිපික් කලාපයේ 15.6% ඒකාබද්ධ අලෙවි වර්ධනය සමඟ ලොතරැයි අලෙවියේ ශක්තිමත් වර්ධනයක් එම කලාපය තුළ පෙන්නුම් කරන ලදී. පැවති තත්ත්වයන් අඛණ්ඩව පවත්වා ගනිමින් ආසියා පැසිපික් කලාප වර්ධනයේ මූලික ප්‍රභවය ලෙස චීනයේ ලොතරැයි මඟින් වන සහභාගීත්වය කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙන ලදී. චීන සුභසාධන ලොතරැයි මාස 12 න් මාස 12 ට 16.7% ක අලෙවි වර්ධනයක් පෙන්නුම් කරන අතරතුර චීන ක්‍රීඩා ලොතරැයි 32.8% ක අලෙවි වර්ධනයක් වාර්තා කරන ලදී. පසුගිය මාස 12 තුළ යුරෝ බිලියන 30 ක (ඇ. ඩොලර් බිලියන 32.2) විකුණුම් වල අතිරික්තයක් සමඟ වාර්ෂික විකුණුම් ධාරිතාවයට අනුව ලොව විශාලතම ලොතරැයිය වනුයේ චීන සුභසාධන ලොතරැයිය වේ. දෙවැනි ස්ථානයට පත්වන ඉතාලියේ ලොටෝ මැටිකා චීනයේ ක්‍රීඩා ලොතරැයියට ඉදිරියෙන් සිටී. ආසියා පැසිපික් කලාපයෙන් ඔබ්බට ඕස්ට්‍රේලියාවේ ලොටරි වෙස්ට් වර්ෂයෙන් වර්ෂය අලෙවි වර්ධනය 1.8% ක ස්ථාවර මට්ටමක පවත්වා ගන්නා අතර එම කාලය තුළ ජපානයේ ටකරා-කුජී ලොතරැයියේ විකුණුම් වල තරමක පසුබෑමක් දක්නට ලැබුණි.

## මෙහෙයුම් පරිසරය

ශ්‍රී ලංකාවේ ලොතරැයි අලෙවිය, ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා ස්ථාපිත කොට ඇති රාජ්‍ය ව්‍යවසාය දෙකෙන් එකක් වනුයේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයයි. එමනිසා අපගේ සංවිධානයේ ව්‍යාපාරික කාර්යසාධනය රඳා පවතිනුයේ රටෙහි සමාජ - ආර්ථික පරිසරය සහ කලින් කලට ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ස්ථාපිත කරනු ලබන රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මත වේ.

## 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය

2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය එහි ආර්ථික දත්ත වල වාර්තා කළ ආකාරයට, 2013 වර්ෂයේ 7.2% ක ආර්ථික වර්ධනය සමඟ සංසන්දනය කරන විට 2014 වර්ෂයේ 7.4% ක ආර්ථික වර්ධනයක් ළඟා කරගෙන ඇත. එම වර්ධනය ඉතා පුළුල් පදනමින් සිදු වී ඇති අතර කර්මාන්ත හා සේවා, ඉදිකිරීම්, නිෂ්පාදන සහ තොග හා සිල්ලර වෙළෙඳාම යන උප ක්ෂේත්‍ර වල ශක්තිමත් ප්‍රසාරණයේ දායකත්වය මත ගොඩ නැගී ඇත. 2014 වර්ෂයේ මුල් කාලය තුළ පැවති නියඟ තත්ත්වය හා අවසාන කාර්තුවේ දී ඇති වූ දැඩි වර්ෂා හා ගංවතුර තත්ත්වය හේතුවෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තරමක පසුබෑමක් දක්නට ලැබුණි. මෙම ඉහළ වර්ධනයට ප්‍රධාන හේතු ලෙස රටතුළ පවතින පශ්චාත් යුදමය සාමකාමී පසුබිම, දේශීය ඉල්ලුම් උසස් වීම, ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වල නව ධාරිතාවය,

පෞද්ගලික ආයෝජන ඉහළ නැගීම, ස්ථාවර සාර්ව ආර්ථික තත්ත්වයන් සහ ගෝලීය ඉල්ලුමෙහි ප්‍රසාරණය වීම හඳුනාගත හැකිය. මෙම වර්ධනීය තත්ත්වය සමඟ 2013 වර්ෂයේදී ඇ.ඩො. 3,280 ව පැවති ඒක පුද්ගල ආදායම ඇ.ඩො. 3,625 ක් දක්වා 2014 වර්ෂයේදී වර්ධනය වී ඇත. අඛණ්ඩව 06 වන වර්ෂයටත් තනි ඉලක්කමක පවතින උද්ධමනයට වඩා ආර්ථික වර්ධනය ඉහළ මට්ටමක පැවතීමද තවත් ධනාත්මක ප්‍රවනතාවයක් ලෙස හඳුනාගත හැකිය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (CCPI-2006/07 පදනම් වර්ෂය) ගණනය කිරීම් වලට අනුව වර්ෂයෙන් වර්ෂය උද්ධමනය පෙර වර්ෂයේ 4.7% ට සාපේක්ෂව 2014 වර්ෂය අවසානයේ 2.1% ක් වී ඇත.

## 2014 සඳහා ආර්ථික පැතිකඩ

අපේක්ෂිත ගෝලීය ආර්ථික උසස් වීම් හා බද්ධ වූ හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්, බාහිර සබඳතා උසස් වීම්, ඉහළ ආයෝජන සහ දේශීය පරිභෝජනයේ අපේක්ෂිත ගුණාත්මක උසස් වීම් මධ්‍ය කාලීන දළ දේශීය නිෂ්පාදනයේ සීඝ්‍ර තිරසාර වර්ධනයකට හේතු වනු ඇතැයි බලාපොරොත්තු වේ.

## රජයේ සහ රාජ්‍ය ව්‍යවසායන්ගේ ආදායම

2013 වර්ෂයට සාපේක්ෂව 152% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2014 වර්ෂය තුළදී ප්‍රාග්ධන හා වර්තන වියදම් සඳහා රු. බිලියන 323.9 කින් මූල්‍ය දායකත්වය ලබාදෙන අතර තුර භාණ්ඩාගාරය විසින් බදු නොවන ආදායම් ලෙස රු. බිලියන 35.31 ක් අය කිරීම් හා ලාභාංශ වශයෙන් එක්රැස් කර ගෙන ඇත. සැලකිය යුතු කරුණ වනුයේ බහුතරයක් මහා පරිමාණ උපායමාර්ගික ව්‍යවසායන්ට ඒකාබද්ධ අරමුදලකට දායක වීමට නොහැකි වී ඇති අවස්ථාවක රාජ්‍ය ව්‍යවසායන් 31 ක් පමණක් මෙම බදු නොවන ආදායමට දායක වීමයි. 2014 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 11 ක් පාඩු ලබන විට රාජ්‍ය ව්‍යවසායන් 44 ක් ඔවුන්ගේ වාණිජ මෙහෙයුම් වලින් ලාභ උපයා ඇත. 2014 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයට රාජ්‍ය ව්‍යවසායන්ගේ දායකත්වය 15.37% කි.

## 2014 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය

වර්තමානයේ දී ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ව්‍යවසායන් 245 ක් ක්‍රියාත්මක වේ. මහා භාණ්ඩාගාරය විසින් ඉන් ව්‍යවසායන් 55 ක් බැංකු හා මූල්‍ය, රක්ෂණ, බලශක්ති, වරාය, ජලය, ගුවන්, ප්‍රජා ප්‍රවාහන, ඉදිකිරීම්, පශු සම්පත්, වැවිලි, පුනර්ජනනීය නොවන සම්පත්, ලොතරැයි, අලෙවිකරණ හා බෙදාහැරීම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය යන කාණ්ඩ යටතේ උපායමාර්ගික වැදගත්කමක් ඇති ව්‍යවසායන් ලෙස හඳුනා ගෙන ඇත. වර්ෂය තුළදී එම ව්‍යවසායන්ගෙන් 44 ලාභ උපයා ඇති අතර 11 ක් පාඩු ලබා ඇත. බලශක්ති, ගුවන්, ප්‍රජා ප්‍රවාහන සහ වැවිලි ක්ෂේත්‍ර වල ව්‍යාපාර මෙහෙයුම් සිදු කරන ව්‍යවසායන්ගේ අලාභ රාජ්‍ය ව්‍යවසායන්ගේ සමුච්චිත ලාභයට සෘණාත්මකව බලපාන ලදී. 2014.12.31 දිනට මූලික රාජ්‍ය ව්‍යවසායන් 55 හි සමස්ත ප්‍රාග්ධනීකරණය රු. බිලියන 5,603.53 ලෙස වාර්තා කර ඇත. එය පසුගිය වර්ෂය හා සංසන්දනය කරන විට 9.95% ක සැලකිය යුතු වර්ධනයකි. 2014.12.31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා එම ව්‍යවසායන් 55 හි සමුච්චිත මෙහෙයුම් ප්‍රතිඵල ලෙස රු. බිලියන 58.35 ක ලාභයක් පෙන්නුම් කර ඇත.

## 2014 වර්ෂයේදී ශ්‍රී ලංකා ලොතරැයි කර්මාන්තය

ශ්‍රී ලංකාවේ ලොතරැයි වෙළෙඳපොළට වඩාත් වේගවත් ලොතරැයි ලබාදෙන ආයතන වනුයේ සංවර්ධන ලොතරැයි මණ්ඩලය හා ජාතික ලොතරැයි මණ්ඩලය පමණි. එම සමාගම් දෙකම රජයේ හිමිකාරීත්වයක් ඇති ව්‍යවසායන් වේ. 2014 වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙළෙඳපොළ කොටස 55% ක් වූ අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයට 45% ක් හිමි විය. ජාතික ලොතරැයි මණ්ඩලය හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි මිලියන 1,396 ක් අලෙවි කර ඇති අතර 2013 වර්ෂයේදී ලබාදුන් ත්‍යාග මුදල් වන රු. මිලියන 13,565 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී රු. මිලියන 13,522 ක් ලබා දී ඇත.

2014 වර්ෂයේදී සමස්ත කර්මාන්තයේම ආදායම රු.මිලියන 25,540 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 1.5% ක තරමක වර්ධනයකි. ජාතික ලොතරැයි මණ්ඩලය 2014 වර්ෂයේදී ඒකාබද්ධ අරමුදලට රු. මිලියන 1,888 ක සමස්ත දායකත්වයක් සපයා ඇති අතර එය 8% ක වර්ධනයකි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. මිලියන 2,345 කින් ජනාධිපති අරමුදලට 2014 වර්ෂයේදී දායක වී ඇත.

# කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

## 2014 මූල්‍ය සමාලෝචනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නිෂ්පාදන කලඹ තුළ ලොතරැයි වර්ග 08 ක් ඇතුළත් වේ. පසුගිය වර්ෂය හා සංසන්දනය කරන විට 2014 වර්ෂයේ සමස්ත ආදායම 2% ක පමණ සුළු පහල වැටීමක් වාර්තා කොට ඇත. පෙර වර්ෂයේ රු. මිලියන 9,941 ක ආදායමට සාපේක්ෂව රු. මිලියන 9,779 ආදායමක්, සලකා බලන මූල්‍ය වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය උපයා ඇත. 2013 වර්ෂයේදී රු. මිලියන 143 ක් වූ වෙනත් ආදායම් රු. මිලියන 151 දක්වා ළඟා වී ඇත. ලොතරැයි අලෙවියෙන් ලද ආදායම අඩු වුවද පසුගිය මූල්‍ය වර්ෂයේදී රු මිලියන 2,195 වූ බදු පෙර ලාභය 10% කින් වර්ධනය වී රු. මිලියන 2,422 වී ඇත. වර්ෂය පුරා ඉහළ කාර්යක්ෂමතා හා පිරිවැය ඉතිරි කිරීම් වල ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් කටයුතු වල උසස් වීම් වල බලපෑමෙන් මෙම මෙහෙයුම් ලාභයේ වර්ධනීය තත්ත්වය නිර්මාණය වී ඇතැයි සැලකිය හැකිය. එය අවසාන වශයෙන් ඉහළ ලාභදායීත්වයක් වෙත රැගෙන ගොස් ඇත. සලකා බලන කාලච්ඡේදය තුළ මුළු වියදම් වල අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ. එය 2013 වර්ෂයේදී රු මිලියන 7,746 ක් පැවති අතර 2014 වර්ෂයේදී රු මිලියන 7,306 කට අඩු වී ඇත. මුළු වියදම් වලින් ටිකට් සඳහා පිරිවැය පසුගිය වර්ෂයේ රු.

# මෙහෙයුම් සමාලෝචනය

මිලියන 410 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී රු. මිලියන 378 ක් වී ඇත. එමෙන්ම ලොතරැයි දිනුම් ඇදීම් පිරිවැය 2013 වර්ෂයේදී පැවති රු. මිලියන 255 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී රු. මිලියන 272 දක්වා ඉහළ ගොස් ඇත. 2013 වර්ෂයේ රු. මිලියන 6,481 ක් වූ ත්‍යාග මුදල් ගෙවීම් පිරිවැය 2014 වර්ෂයේදී රු. මිලියන 6,211 ක් වී ඇත.

2013 වර්ෂයේදී ජනාධිපති අරමුදලට දායක කළ රු. මිලියන 2,026 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී රු. මිලියන 2,068 ක ඉහළ දායකත්වයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිදුකර ඇත. ජනාධිපති අරමුදලට සඳහා අරමුදල් දායකත්වය 2% කින් වර්ධනය වී ඇත.

## නිෂ්පාදිත කාර්යසාධනය

සලකා බලන වර්ෂය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි 10 ක මෙහෙයුම් සිදු කරන ලදී. ඒවායේ කාර්යසාධනය පහත පරිදිය.

| නිෂ්පාදිතය | විකුණුම් වටිනාකම 2014 (රු. මිලියන) | සමස්ත ආදායමට දායකත්වය (%) |
|---|---|---|
| ශනිදා වාසනාව | 2,007 | 19 |
| සංවර්ධන වාසනාව | 2,493 | 24 |
| ජයෝදා | 1,255 | 12 |
| ජනජය | 854 | 08 |
| නියත ජය | 1,025 | 10 |
| සුපර් බෝල් | 2,315 | 22 |
| හයිවේ ඩ්‍රීම් | 154 | 01 |
| ක්ෂණික ලොතරැයි ටිකට් පත | 285 | 03 |
| එකතුව | 10,388 | 99 |

ඉහත නිෂ්පාදන කලඹෙන්, නිෂ්පාදිත 04 ක් ම පසුගිය මූල්‍ය වර්ෂය තුළදී හඳුන්වා දුන් ඒවා වන අතර සාපේක්ෂව එම නිෂ්පාදිත වෙළෙඳපොලට නව්‍ය ඒවා වේ. එම නිෂ්පාදිත නම් සංවත්සර වාසනා, අවුරුදු බෝනස්, හයිවේ ඩ්‍රීම් සහ සුපිරි ශනිදා වේ.

## බෙදාහැරීම් ජාලය

දැනට සංවර්ධන ලොතරැයි මණ්ඩලය රට පුරා ක්‍රියාකාරී නියෝජිතයින් 2,200 ක් හා ආසන්න වශයෙන් අලෙවි සහායකයින් 22,000 ක පමණ ජාලයකින් ක්‍රියාත්මක වේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලය යටතේ දැනට ඍජු හා වක්‍ර රැකියා අවස්ථා 25,000 ක් පමණ නිර්මාණය කර ඇත. මෙම පුළුල් වූ ජාලය තුළින් රටේ ජනතාවට ජීවිතයේ සෑම අවස්ථාවකම දිනුම් අවස්ථා උදාකර ගනිමින් තම ජීවිතය වෙනස් කරගැනීමට හා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නිෂ්පාදන වලට පහසුවෙන් සම්බන්ධ වීමේ අවකාශය සහතික කර ඇත. ඊට අමතරව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙබ් අඩවිය තුළ අලෙවිකරණ හා ප්‍රවර්ධන වීඩියෝ වලට සහ දිනුම් තොරතුරු වලට අවතීර්ණ වීමට අවකාශ සලසමින් අන්තර්ජාලය තුළද විවිධ අලෙවි උත්සාහයන් සිදු කර ඇත.

## අලෙවිකරණ සහ නිෂ්පාදිත සංවර්ධන

ප්‍රවර්ථන මූල්‍ය වර්ෂය තුළදී හයිවේ ඩ්‍රීම්, ජයෝදා, ශනිදා වාසනාව සහ සංවර්ධන වාසනාව යන වඩා ප්‍රචලිත නිෂ්පාදන 04 ට නව උප සන්නාම ලොතරැයි ටිකට් පත් හඳුන්වා දෙමින් ඒවා තවදුරටත් ශක්තිමත් කරන ලදී. නව දිනුම් අවස්ථා නිර්මාණය කරමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නිෂ්පාදන කෙරෙහි ජනතා අවධානය තවදුරටත් රඳවා ගනිමින් අලෙවියේ වර්ධනයක් කරා ගෙන යාමට මෙම නව ලොතරැයි වලට හැකියාව ලැබුණි.

## ජයෝදා පවර් බෝල්

ජයෝද පවර් බෝල් ලොතරැයිය 2014 අගෝස්තු මස 28 වන දින වෙළෙඳපොලට හඳුන්වා දෙන ලදී. මාසයක කාලසීමාවක් තුළ ලොතරැයි ටිකට් පත් 1,633,000 අලෙවි කළ අතර එහි පළමු දිනුම් ඇදීම ඉතා සාර්ථකව 2014 සැප්තැම්බර් මස 29 වන දින පවත්වන ලදී.

### සුපිරි ශනිදා

2014 සැප්තැම්බර් මස 30 වන දින සුපිරි ශනිදා ලොතරැයිය හඳුන්වාදීමත් සමග ඉතා ජනප්‍රිය ශනිදා වාසනාව තවදුරටත් ප්‍රසාරණය කරන ලදී. මෙම නව ලොතරැයියෙහි ජනප්‍රියත්වයේ ආධාරයෙන් සහ ටිකට්පත් 2,572,650 ක දැවැන්ත අලෙවි පසුබිමත් තුළ 2014 නොවැම්බර් මස 01 දින පළමු දිනුම් ඇදීම සිදු කරන ලදී.

### පවර් ස්ටාර්

2014 නොවැම්බර් මස 02 දින පවර් ස්ටාර් ලොතරැයිය ජනතාවට නව දිනුම් අවස්ථාවක් උදා කරමින් සංවර්ධන ලොතරැයිය යටතේ නව අඩියරක් ලෙස හඳුන්වා දෙන ලදී. එහි ටිකට් පත් 2,186,050 අලෙවි කළ අතර පළමු දිනුම් ඇදීම 2014 දෙසැම්බර් මස 02 දින පවත්වන ලදී.

### නියෝජිත දීමනා සැලැස්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි අලෙවිය වර්ධනය කරන අතරතුර නියෝජිතයන්ගේ හා බෙදාහරින්නන්ගේ ආදායම ඉහළ යන ආකාරයේ දීමනා ක්‍රමයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය හඳුන්වා දෙන ලදී. එහි ආකර්ෂණීය ඉපයුම් හැකියාව නිසා එම ක්‍රමය ඉතා ජනප්‍රිය විය. එය කණ්ඩායම් දීමනා සැලැස්මක් හෙයින් ඉන් ඉහළ ප්‍රතිලාභ ලැබීමට නම් බෙදාහරින්නන් සහ නියෝජිතයින් කණ්ඩායමක් ලෙස කාර්යක්ෂමව කටයුතු කළ යුතුය.

2014 සැප්තැම්බර් 01 දින සිට නව උපායමාර්ගික සැලස්මක් ප්‍රවර්ථන මූල්‍ය වර්ෂය තුළදී දිවයින පුරා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි හා බෙදාහැරීම් ජාලය තුළ සන්නිවේදනය කළ අතර ඒ තුළින් වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ අලෙවි ඉලක්කයන් සම්පූර්ණ කිරීමට සෘජුවම දායක විය. නව මූල්‍ය වර්ෂය තුළදී ද අපේක්ෂිත ප්‍රතිඵල ඉක්මවා අලෙවි හා ලාභ තත්ත්වයන් ළඟාකරගැනීමට මෙම නව ප්‍රතිලාභ සැලැස්ම අලෙවි හා බෙදාහැරීම් ජාලය අභිප්‍රේරණය කරනු ඇතැයි අප තුළ විශාල විශ්වාසයක් පවතී.

නියෝජිතයින් ඔවුන්ගේ අලෙවි සහ ආදායම් ඉහළ නංවා ගැනීමට අදාළ තාක්ෂණික හා අනෙකුත් උපකාර සපයා දීමට කොළඹ, අනුරාධපුරය, ගාල්ල සහ කුරුණෑගල යන නගර වල රැස්වීම් සංවිධානය කරන ලදී.


01
06
03
S
තිරසාරත්වය පිළිබඳ
වාර්තාව

# තිරසාරත්වය පිළිබඳ වාර්තාව

03

රටෙහි සුභසාධන අවශ්‍යතා සපුරාලීම සඳහා ස්ථාපිත කළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය පසුගිය දශක තුනක කාලයක් තිස්සේ ජනාධිපති අරමුදලට අරමුදල් ලබාදීම් තිරසාර මූලාශ්‍ර සපයමින් තිරසාරත්වය සපිරි ව්‍යාපාර ඒකකයක් බව සනාථ කොට ඇත. ජනාධිපති අරමුදලට ලබාදෙන දායකත්වය ස්ථාවර මට්ටමක රඳවා ගැනීම සහතික කරමින් වසර ගණනාවක් තිස්සේ ආදායම හා ලාභදායිත්වය ඉහළ දැමීමට මණ්ඩලය විසින් සංවර්ධනය කළ ව්‍යාපාරික උපායමාර්ග ඉතා සාර්ථක විය. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු ද ඇතුලුව ඉහත දායකත්වයන් සමඟ වරප්‍රසාද ලබන රටෙහි ජනතාවට ආර්ථික තිරසාරභාවය සම්පාදනය කොට ඇත.

රාජ්‍ය ආයතනයක් ලෙස ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවිත වලට ස්ථාවර සහ තිරසාර බවින් යුක්ත වටිනාකම් නිර්මාණය කළ හැකි වර්ධනයක් සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් බැඳේ. සමාජ, පාරිසරික හා ආර්ථික වගකීම් පවත්වා ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කළ ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ සඳහන් කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමාජ වගකීම් තුළ ව්‍යාපාරික වගකීම්, පාරිභෝගික හා ලොතරැයි ජයග්‍රාහක ආරක්ෂණ ක්‍රියාමාර්ග මෙන්ම ප්‍රජා සුභසාධන වැඩසටහන් ද ඇතුළත් වේ. සාංගමික ක්‍රියාකාරකම් වලින් පරිසරයට කරනු ලබන බලපෑම් සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිරන්තරව නිරීක්ෂණය කරන අතර පාරිසරික වගකීම ඉටු කිරීම සඳහා බලශක්ති ඉතිරිකිරීමේ ආයෝජනය සිදු කර ඇත. ආර්ථික වගකීම් මගින් විනිවිදභාවයෙන් යුක්ත හා සමබර යහපාලන අකෘතියන්ට පරිවර්තනය වනු ඇත.

**සංවිධාන ව්‍යුහය - ලොතරැයි මණ්ඩලය**



# තිරසාරත්වය පිළිබඳ වාර්තාව

## අපගේ වටිනාකම්

අපගේ එකම අරමුණ වනුයේ ශ්‍රී ලංකාව පුරා සිටින මිනිසුන්ගේ ජීවිතය සෞභාග්‍යමත් කිරීමයි. එසේම ප්‍රාදේශීය වශයෙන් ආදායම් උත්පාදනය හා සමාජ ප්‍රතිලාභ හරහා එය යථාර්ථයක් බවට පත් කිරීමට අපට හැකි විය. පුදුමයන් නිර්මාණය කිරීම හා සිහින සැබෑ කිරීම ඉලක්ක කරගන්නා අතරතුර වගකීමෙන් යුක්ත ලොතරැයි ලබාදෙමින් හා විශ්වාසය ගොඩනැගීම අපගේ බැඳීම වන අතර අපගේ සාර්ථකත්වය අප උපයන ලාභය හා උත්පාදනය කරන රැකියා මත තීරණය වේ.

පාරිභෝගිකයින්ට සේවා සැපයීමේදී ඉහළ ප්‍රමිතීන් සකස් කිරීම හා ඒවාට අනුගත වීමේ පොදු කැමැත්තට අනුව කටයුතු කිරීමෙන් අපගේ වගකීම අපි පිළිගනිමු. එමෙන්ම අප ක්‍රියා කරනුයේ විශ්වාසවන්තවය. එනම් අප කරනුයේ හරි දේ යන්නයි. අපගේ පාරිභෝගිකයින් හා ව්‍යාපාර හවුල්කරුවන් අපට කියන දේ සහ ශ්‍රී ලාංකික ප්‍රජාව අපෙන් අපේක්ෂා කරන දේවල් අප මනාව කළමනාකරණය කර ගන්නෙමු. අපි අපගේ පාරිභෝගිකයින්ට, සේවකයින්ට, හවුල්කරුවන්ට හා ශ්‍රී ලාංකීය ජනතාවට ගරු කරන්නෙමු. එමෙන්ම අප වටා වූ විවිධාකාර මිනිසුන්ට හා අදහස් වලට විවෘතව හා අවංකව ඇහුම්කම් දීමත් සමඟ ඔවුනට ගරු කිරීම ආරම්භ කරන ලදී.

## මානව සම්පත්

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ පරිචයන් සාංගමික හා ජාතික අරමුණු හා සමගාමීව ගොඩනැගී ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මහජන සේවා නියෝජනය හා ගැලපෙන ලෙස ඉතා උසස් අන්දමේ සේවා සැපයීමට දිරිමත් වන අයුරින් සේවකයින් පුහුණු කොට ඇත.

2014 දෙසැම්බර් 31 දින අපගේ සමස්ත මානව ප්‍රාග්ධනය පුද්ගලයින් 228 කින් සමන්විත වේ. ඉන් 11 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත වන අතර එක් සේවකයකු දෙවන අනුයුක්ත කිරීමක් (Secondment) වේ.

### 2014.12.31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අනුමත සේවක අවශ්‍යතාවය

| තනතුර | අනුමත සේවක ගණන | දැනට සිටින සේවක ගණන | ඌනතාවය | අතිරික්තය |
|---|---|---|---|---|
| සභාපති | 1 | 1 | | |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 1 | 1 | | |
| සාමාන්‍යාධිකාරී | 1 | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) | 1 | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | 1 | 1 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) | 3 | 3 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | 3 | 2 | 1 | |
| අභ්‍යන්තර විගණක | 1 | වැඩබලන | 1 | |
| ප්‍රවාහන හා නඩත්තු නිලධාරී | 1 | 1 | | |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 1 | 1 | | |
| රහස්‍ය ලේකම් | 1 | 1 | | |
| අලෙවි ප්‍රවර්ධන නිලධාරී | 14 | 17 | | 3 |
| මහජන සබඳතා නිලධාරී | 1 | 1 | | |
| සහකාර තොරතුරු තාක්ෂණ නිලධාරී | | වැඩබලන | | |
| පර්යේෂණ සහකාර | 0 | 1 | | 1 |
| මූල්‍ය සහකාර | 2 | 0 | 2 | |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | 1 | 1 | | |
| කළමනාකරණ සහකාර | 83 | 89 | | 6 |
| කළමනාකරණ සහකාර (දමිල) | 2 | 3 | | 1 |
| මාධ්‍ය සම්බන්ධීකාරක | 0 | 1 | | 1 |
| අලෙවි සම්බන්ධීකාරක * (කොන්ත්‍රාත්) | 11 | 2 | | |
| රියදුරු | 31 | 34 | | 3 |
| කා.කා.ස/ කාර්යාල කම්කරු | 36 | 47 | | 11 |
| විදුලි කාර්මික | 1 | 0 | 1 | |
| ආරක්ෂක සහකාර | 3 | 16 | | 13 |
| එකතුව | 200 | 225 | 5 | 39 |
| | | | | |
| තොරතුරු තාක්ෂණ උපදේශක | | 1 | | |
| අලෙවිකරණ උපදේශක | | 1 | | |
| | | 228 | | |

* කොන්ත්‍රාත් පදනම මත වූ තනතුරු 11 එක් වසරක් සඳහා අනුමත වී ඇත. 2014.10.15 සිට 2015.10.15 දක්වා බලපැවැත්වේ.

01

**සේවා ගිවිසුම අනුව සේවකයින්**




**වයස අනුව සේවක වර්ගීකරණය**




## සේවක බඳවා ගැනීම

වර්ෂය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කටයුතු වල සහයෝගය ලබා ගැනීමට නව බඳවා ගැනීම් 02 ක් සිදු කරන ලදී. එම බඳවා ගැනීම් පහත පරිදිය.

## සේවක ඛාණ්ඩය අනුව සේවක වර්ගීකරණය

**සේවක කාණ්ඩය අනුව සේවක වර්ගීකරණය**




**ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක වර්ගීකරණය**




## සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවක ප්‍රතිලාභ

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් එහි සේවකයින්ට ව්‍යවස්ථාපිත නියමයන් ඉක්මවා ප්‍රතිලාභ රැසක් ඇත. ඒවා නම්,

- සේවක රක්ෂණය
- සේවක ප්‍රතිලාභ
- නිවාස ණය
- ආපදා ණය
- වසරකට දෙවරක් ප්‍රසාද දීමනා

## පුහුණුව හා සංවර්ධනය

ඵලදායීතාව සහ ඉහළ ගුණාත්මයේ කාර්ය මණ්ඩලයක් සහතික කිරීමට මානව සම්පත් කළමනාකරණයේ ප්‍රධාන භූමිකාවක් හොබවනු ලබන්නේ පුහුණුව හා සංවර්ධනයයි.

**පුහුණු වැඩසටහන**

CAD මධ්‍යස්ථානයේ පැවති දින 02 හි පරිගණක පුහුණුව එය සේවකයින් කාණ්ඩ වශයෙන් පුහුණු කරනු ලබන ඉදිරියට සිදුවන පුහුණු වැඩසටහනකි.

**පුහුණුව ලැබූ පුද්ගලයින් ගණන**

වර්ෂය තුළදී ලිපිකාර සේවකයින් 75 කට වැඩි පිරිසක් පුහුණුව ලබන ලදී.

## සේවක සමාජීය ඉසව්

බොහොමයක් සේවක සමාජීය ඉසව් වාර්ෂිකව පවත්වනු ලබන්නේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සියලුම ශ්‍රේණි වල සේවය කරන සේවකයින්ගේ කණ්ඩායම් කුසලතාවය හා එකමුතු බව උසස් කිරීම සඳහාය. අපගේ සේවකයින් ඉහළ උද්යෝගයකින් සහභාගි වූ වාර්ෂික ක්‍රීඩා ඉසව් වර්ෂය තුළදී කැපී පෙනුණි.

# තිරසාරත්වය පිළිබඳ වාර්තාව

- වර්ෂය තුළදී වෙළඳ සේවා අංශ 02 20:20 ක්‍රිකට් තරගාවලියේ අවසන් පූර්ව වටයට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සුදුසුකම් ලබන ලදී. දැල් පන්දු කණ්ඩායම ජාතික තරඟ වලට සහභාගි වූ අතර මලල ක්‍රීඩා අංශයෙන් සිංගප්පූරුවේ විවෘත ප්‍රවීන මලල ක්‍රීඩා තරඟය හා තායිලන්තයේ පැවති 2015 ක්ෂේත්‍ර ශූරතාවය සඳහා ඉදිරිපත් විය. එහිදී ඒ. ඒ. ඩී. සී. පී. අමරසිංහ රන්, රිදී හා ලෝකඩ පදක්කම් දිනා ගනිමින් රටට විශාල ගෞරවයක් ගෙන එන ලදී.

- මෙම වර්ෂයේ දීත් සේවක මණ්ඩලයේ පවුලේ සාමාජිකයින්ද ඇතුලුව 400 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වාර්ෂික සේවක විනෝද චාරිකාව සංවර්ධන ලොතරැයි මණ්ඩලය සංවිධානය කරන ලදී. එක් දින විනෝද චාරිකාව බෙන්තොට බීච් හෝටලයේ පැවති අතර එය ඉතා විනෝදජනක අතර, සේවකයින් සුහදශීලීව හා එකමුතුව කටයුතු කිරීමද දැකගත හැකිවිය.

- සම්ප්‍රදායිකව අලුත් අවුරුද්ද සැමරීම නිමිත්තෙන් සේවකයින් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ද ඇතුලුව සංවිධානය කළ වාර්ෂික අවුරුදු උත්සවය පැවත්වීමද සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයින් ඉතා සුහදශීලීව සිදු කරන ලදී.

- වෙසක් පොහොය නිමිති කොටගෙන සියලුම සේවකයින්ගේ සහභාගිත්වයෙන් 2014 මැයි මස 06 දී සංවර්ධන ලොතරැයි මණ්ඩල පරිශ්‍රයේදී 200 කට අධික මහජනතාවක් සඳහා දන්සලක් පවත්වන ලදී.

## සාංගමික සමාජ වගකීම් ප්‍රතිපත්තිය

සමාජ සුභසාධනය සඳහා පහසුකම් සැපයීම නම් වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යවස්ථාපිත අරමුණු වලට සමගාමීව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සාංගමික සමාජ වගකීම් ප්‍රතිපත්තිය හවුල් කරුවන් සමඟ ව්‍යාපාර සබඳතා ගොඩනඟා ගැනීම හා ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන ප්‍රමිතිය උසස් කිරීම ඉලක්ක කරගෙන ඇත.

දිවයින පුරා අපගේ බොහොමයක් බෙදාහරින්නන් හා නියෝජිතයින් විවිධ ආබාධිත තත්ත්වයන් ඇති පුද්ගලයන් මෙන්ම ආර්ථික වශයෙන් විවිධ අපහසුතා ඇති සමාජ කණ්ඩායම් වල පුද්ගලයින් ද වේ.




එම නිසා අපගේ ප්‍රජා සංවර්ධන වැඩසටහන් හරහා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහ දුප්පත් බව තුරන් කිරීමට අප අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

2014 වර්ෂය තුළදී අපගේ බෙදාහරින්නන්ගේ හා නියෝජිතයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ස්ථාපිත කළ සාංගමික සමාජ වගකීම් ක්‍රියාමාර්ග හරහා ව්‍යාපාරය සඳහා හරාත්මක ජාලයක් සංවර්ධනය කිරීම තුළින් වගකීම් සහගත ලොතරැයි ව්‍යාපාර අරමුණු ශක්තිමත් කිරීමට තවදුරටත් උත්සාහ දරණ ලදී. අධ්‍යාපනය, ප්‍රජාව හා සේවකයින් ඉලක්ක කරගත් ශ්‍රී ලංකාව පුරා විහිදුනු විවිධාකාර සමාජ වගකීම් ක්‍රියාමාර්ග සඳහා ද සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහාය ලබා දෙන ලදී.

## ආර්ථික වගකීම

ප්‍රධාන ලොතරැයි 06 න් හා ක්ෂණික ලොතරැයි 03 කින් උපයන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමස්ත ලාභය රටෙහි සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි ප්‍රතිලාභ සඳහා ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කරනු ලබයි. පහත දැක්වෙන එකතු කළ ආර්ථික වටිනාකම් ප්‍රකාශනය මඟින් 2014 වර්ෂය තුළදී නිර්මාණය කළ හා බෙදාහරින ලද ආර්ථික වටිනාකම් විස්තර කිරීමක් සිදු කරනු ලැබේ.

| ආර්ථික වටිනාකම | 2014 (රු. මිලියන) | % |
|---|---|---|
| **සෘජු ආර්ථික වටිනාකම් උත්පාදනය** | | |
| ආදායම | 9,728 | |
| **ආර්ථික වටිනාකම් බෙදාහැරීම** | | |
| මෙහෙයුම් පිරිවැය | 734 | 8% |
| වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ හා පුහුණු | 207 | 2% |
| ලොතරැයි ජයග්‍රාහකයින්ට කළ ගෙවීම් | 6,211 | 64% |
| බෙදාහරින්නන්ට හා අලෙවි නියෝජිතයින්ට කළ ගෙවීම් | 154 | 2% |
| ජනාධිපති අරමුදලට කළ ගෙවීම් | 2068 | 21% |
| රජයට කළ ගෙවීම් | 354 | 4% |
| එකතුව | 9,728 | 100% |

2014 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් 21% ක්ම අවශ්‍යතාවයන් මත නැවත බෙදාහැරීම සඳහා ජනාධිපති අරමුදලට බැර කරන ලදී. ඊට අමතරව එහි උත්පාදිත ආර්ථික වටිනාකම් වලින් 64% ක් ලොතරැයි ජයග්‍රාහකයින් හරහා නැවත සමාජයට මුදාහරින අතරතුර 2% ක් බෙදාහරින්නන් හා නියෝජිත ව්‍යාපාර ජාලය අතර බෙදාහරියි. සංවිධානය උත්පාදනය කළ ආර්ථික වටිනාකම් වලින් තවත් 2% කින් සේවකයින් ප්‍රතිලාභ ලබයි.

රටෙහි හා ජනතාවගේ සුභසිද්ධිය සඳහා සමාජ සුභසාධනයට සහය වීම යන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යවස්ථාපිත අරමුණ ඉහළින් ඔසවා තැබීම සඳහා උත්පාදනය කළ මුළු ආර්ථික වටිනාකම වන රු. මිලියන 9,728 විවිධ අරමුණු හරහා සමාජයට නැවත බෙදාහරින ලදී.

## සාංගමික සමාජ වගකීම් වැඩසටහන්

වර්ෂය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2,000 අලෙවි නියෝජිතයින් හා 20,000 පමණ අලෙවි සහායකයින් ඔවුන්ගේ නිතිපතා ආදායම් මාර්ගයට අමතරව බොහොමයක් පුණ්‍ය කටයුතු සඳහා සහයෝගය අඛණ්ඩව ලබාදීම. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 30 වන සංවත්සරය නිමිත්තෙන් 2013 වර්ෂය තුළ ක්‍රියාවට නැංවූ අබාධිත හා අඩු ආදායම් ලබන බෙදාහැරීම් ජාල සාමාජිකයින් වෙනුවෙන් පාපැදි, ට්‍රයිසිකල්, හා ඇස් කණ්ණාඩි ලබාදීමේ සාංගමික සමාජ වගකීම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදීත් ක්‍රියාවට නැංවීම

| දිස්ත්‍රික්කය | පාපැදි | ට්‍රයිසිකල් | ඇස්කණ්නාඩි |
|---|---|---|---|
| මාතලේ | 38 | 03 | 630 |
| අනුරාධපුරය | 25 | 13 | 370 |
| යාපනය | 29 | - | - |
| කිලිනොච්චිය | 10 | 02 | 469 |
| වවුනියාව | 17 | 01 | - |
| එකතුව | 119 | 19 | 1469 |

## නියෝජිතයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ වන්නේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව,වෛද්‍ය සහනාධාර හා අලෙවි නියෝජිතයින් සඳහා වන රැස්වීම් වේ. වර්ෂය තුළදී දේශීය විශ්ව විද්‍යාල වල උසස් අධ්‍යාපනය ලබන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලියාපදිංචි නියෝජිතයින්ගේ දරුවන් 100 ක් පමණ අධ්‍යාපන ශිෂ්‍යත්ව හරහා ප්‍රතිලාභ ලබන ලදී.

උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට ප්‍රතිඵල ලබාගෙන රජයේ විශ්ව විද්‍යාල වලට ඇතුළු වූ අපගේ නියෝජිතයින්ගේ දරුවන්ට සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් අධ්‍යාපනික ශිෂ්‍යත්ව 100 ක් පිරිනමන ලදී. ඉහත ශිෂ්‍යත්ව වලට අමතරව ජාතික මට්ටමේ විභාග වලදී විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් අපගේ සේවකයින්ගේ දරුවන්ටද ශිෂ්‍යත්ව 10 ක් පිරිනමන ලදී.

## වෛද්‍ය සහනාධාර

ඊට අමතරව, 113 ක් පමණ අලෙවි සහ සහාය අලෙවි නියෝජිතයන් වෛද්‍ය පහසුකම් සඳහා දීමනා ලබන ලදී.

## නියෝජිත රැස්වීම්

වර්ෂය තුළදී පහත නියෝජිත රැස්වීම් පවත්වන ලදී.

| දිස්ත්‍රික්කය | දිනය |
|---|---|
| කොළඹ | 2014 දෙසැම්බර් 07 වන දින |
| අනුරාධපුරය | 2014 දෙසැම්බර් 14 වන දින |
| ගාල්ල | 2014 දෙසැම්බර් 21 වන දින |
| කුරුණෑගල | 2014 දෙසැම්බර් 28 වන දින |

## පාරිසරික වගකීම

පරිසරයට ඇති කරනු ලබන ඍණාත්මක බලපෑම අවම කිරීම තුළින් හා සම්පත් සංරක්ෂණය තුළින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය එහි පාරිසරික වගකීම් ඉෂ්ට කරන ලදී.

- වර්ෂය තුළදී අපගේ සංවිධානයේ පැරණි රථ වාහන, මෝටර් සයිකල් හා වෙනත් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අයිතම ප්‍රතිචක්‍රීකරණය කොට රු. මිලියන 1.8 ක් උපයා ගන්නා ලදී.

- සෑම මාස 06 කට වරක්ම අපගේ ව්‍යාපාර ජාලය හරහා සියලුම ජයග්‍රාහී ටිකට් පත් එකතු කොට ප්‍රතිචක්‍රීකරණය සඳහා යවනු ලැබේ.


09
02
04
G
සාංගමික යහපාලන වාර්තාව

# සාමූහික පාලනය

රජයේ අයිතිය ඇති ව්‍යාපාරයක් වශයෙන් එහි ව්‍යාපාර කටයුතු වල විනිවිදභාවය හා වගවීමත් යහපාලන පරිසරයක් පවත්වාගෙන යාමටත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහජනතාවට හා රජයට බැඳී සිටී. එම නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුළ තීරණ ගැනීමේදී හා දෛනික ව්‍යාපාර කටයුතු වලදී ප්‍රධාන සාධකයක් වන්නේ පටිපාටිය හා නියාමන අනුකූලතාවය සහතික වන යහපාලනයයි. සංවිධානයේ විශ්වාසනීයත්වය, විනිවිදභාවය හා වගකීම ඉහළ නංවන අතරතුර සියලුම පාර්ශවකරුවන්ගේ ඇල්ම ආරක්ෂා වන අයුරින් යහපාලන ප්‍රමිතීන් රඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. ප්‍රජාවට ඇති පුළුල් වූ වගකීම මෙන්ම හිමිකරුවන්ට, බෙදාහරින්නන්ට, නියෝජිතයින්ට, අලෙවි සහායකයින්ට, පාරිභෝගිකයින්ට, සේවකයින්ට, ණයහිමියන්ට හා අනෙක් පාර්ශවයන් කෙරෙහි ඇති වගකීම සියල්ලටම වඩා වැදගත් වේ.

අදාල නෛතික හා නියාමන රාමුවට සහ සියලුම අනෙකුත් නිතී සඳහා අනුකූලතාව සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිරන්තරව පවත්වා ගනියි. පහත සඳහන් දෑ තුළින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සාංගමික යහපාලන ව්‍යුහය සහ සලකා බලන වර්ෂය තුළදී ගෙන ගිය යහපාලන පරිචයන් පැහැදිලි කරනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රධානියා වනුයේ සභාපතිවරයා වන අතර ඔහු විසින් ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන්ද ආයතනයට නායකත්වය ලබා දේ. අධ්‍යක්ෂ මණ්ඩලය යනු සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධීක්ෂණ වගකීම ඇති ඉහළම පාර්ශවයයි. අධ්‍යක්ෂ මණ්ඩලයට සභාපතිතුමන් ඇතුලුව පහත පරිදි පත්වන අධ්‍යක්ෂවරු 04 දෙනෙකු ඇතුළත් වේ.

- ජනාධිපති අරමුදල නියෝජනය වන
- මහපොළ භාර අරමුදල නියෝජනය වන
- මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය නියෝජනය වන
- විෂය භාර අමාත්‍යවරයා පත් කරනු ලබන දෙදෙනකු (මින් එක් අයකු සභාපතිවරයා වේ)

### සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම්

- සභාපතිවරයා විසින් සාංගමික යහපාලන පැවැත්ම සහතික කළ යුතුය.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල මුලසුන දැරීම සහ නිසි පරිදි වාර්තා පවත්වා ගැනීම සහතික වීම.
- සියලුම අධ්‍යක්ෂවරුන්ට සමානව සැලකිය යුතු අතර ඔවුන්ගේ විශේෂඥ දැනුම උපරිමයෙන් යොදවා ඵලදායී භූමිකාවක කටයුතු කිරීමට දිරිගැන්වීම.
- ව්‍යාපාරයේ කටයුතු සඳහා සමස්ත තීරණ ගැනීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන බවට සභාපතිවරයා සහතික විය යුතුය.
- සභාපතිවරයා විසින් පැහැදිලි වගකීම් බෙදාහැරීම සහ බලය හා අධිකාරිය සමබර කිරීම සහතික කළ යුතුය.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රජයේ ප්‍රතිපත්ති වලට සමගාමීව ව්‍යාපාරය කාර්යක්ෂම ලෙස කළමනාකරණය වන බවට සහතික වීමට වගකීමෙන් බැඳේ. සම්පත් ආරක්ෂා කිරීම, නිසි ගිණුම් පවත්වා ගැනීම, නිවැරදි වාර්තා සකස් කරන බවට සහතික වීම සහ කළමනාකරණයට අදාල සියලුම ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතා වලට අනුකූලතාව සහතික වීම වැනි දෑ සිදු කරන අතරතුර ඉහත වගකීම ඉෂ්ට කළ යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත දෑ සහතික විය යුතුය.

- ව්‍යාපාරයට උපායමාර්ගික ඉලක්ක පවතින බව.
- උපායමාර්ගික ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය නායකත්වය ලබා දී ඇති බව.
- ප්‍රධාන විධායක නිලධාරියාට හා කළමනාකරණ කණ්ඩායමට අවශ්‍ය දක්ෂතා, දැනුම හා නිපුණතාවයන් ඇති බව.
- අභ්‍යන්තර පාලනය හා අවදානම් කළමනාකරණය සඳහා ඵලදායී පද්ධතියක් පවතින බව.
- ව්‍යාපාරයේ කළමනාකරණ ශ්‍රිතයන් ඵලදායීව සුපරීක්ෂණය වන බව
- මූල්‍ය කරුණු මත කොටස් හිමියන්ට ප්‍රමාණාත්මක වාර්තාකරණය සහ නිතිපතා සිදුකළ යුතු අවශ්‍ය අනාවරණයන් සිදුවන බව
- සම්පත් සහ වත්කම් වගකීමෙන් භාවිතා වන බව
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව හා අනෙකුත් කමිටු පත් කළ යුතුය. අචාරධර්ම සංග්‍රහයක් හා සාංගමික යහපාලන උපායමාර්ගයන් හඳුන්වා දීම.
- අදාල ව්‍යවස්ථාවන්, මර්ගෝපදේශ හා චක්‍රලේඛන වලට අනුකූල වීම තුළ ඔවුන්ගේ සියලුම කටයුතු වලට අධ්‍යක්ෂ මණ්ඩලය වගවිය යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සහ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය අවම වශයෙන් වාර්ෂිකව ඇගයිය යුතුය.

# සාමූහික පාලනය

02

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අයවැය සහ අදාල ප්‍රමිත සමඟ මෙහෙයුම් හා ප්‍රතිඵල ඉතා සුපරීක්ෂාකාරීව හා නිතිපතා නිරීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කළ යුතු වෙනත් කරුණු වේ නම් ඒවා විස්තරාත්මකව සඳහන් කරමින් සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කළ යුතුය. සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස්වන අතර අවශ්‍යතාවය මත විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පැවැත්වූ රැස්වීම් හා ඒවායේ පැමිණීම පහත පරිදි වේ.

| අධ්‍යක්ෂවරයා | සහභාගි වූ | සහභාගි නොවූ |
|---|---|---|
| වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ මහතා | 12 | 0 |
| නීතිඥ ගාමිණි ඒකනායක මහතා | 11 | 1 |
| රංජිත් තේනුවර මහතා | 12 | 0 |
| ඩී. එන් නානායක්කාර මහතා | 12 | 0 |
| ආර්. කේ ජයලත් මහතා | 12 | 0 |

## සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කමිටු

- කළමනාකරණ කමිටුව
- විගණන හා කළමනාකරණ කමිටුව
- ටෙන්ඩර් මණ්ඩල කමිටුව
- සේවක සුභසාධක කමිටුව
- ප්‍රචාරක කමිටුව
- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සංස්කෘතික හා කලා සමිතිය

## අනුකූලතා නිලධාරී

මූල්‍ය අංශයේ ප්‍රධානියා වන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය අනුකූලතා නිලධාරී තනතුර හොබවන අතර එතුමන් විසින් නියාමන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට සහ මණ්ඩලය පාලනය කරනු ලබන නීතී හා රෙගුලාසි වලට අනුකූල වන බව සහතික කරනු ලැබේ.

## කළමනාකරණය

මණ්ඩලයේ දෛනික මෙහෙයුම් ඉහළ කළමනාකාරිත්වයට පවරා ඇති අතර ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ ප්‍රධානත්වය දරන්නේ සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාය. ඔවුන් විසින් අවදානම් හා අවස්ථා හඳුනාගත් බවටත් නිශ්චිත කාලය තුළ අයවැයගත ඉලක්කයන් වෙත ළඟා වීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවටත් සහතික විය යුතුය.

## විගණන කමිටුවේ සංයුතිය

පහත විධායක නොවන අධ්‍යක්ෂකවරු තිදෙනාගෙන් විගණන කමිටුව සමන්විත වේ.

01. රංජිත් තේනුවර මහතා - සභාපති
02. ඩී. එන් . නානායක්කාර මහතා - සාමාජික
03. ආර්.කේ. ජයලත් මහතා - සාමාජික

## විගණන කමිටුවේ භූමිකාව

මණ්ඩලයේ වත්කම් සහ පාර්ශවකරුවන්ගේ ඇල්ම ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගැනීම සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිදුකළ යුතුය. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයෙන් හා අනෙකුත් අදාල අධිකාරීන් විසින් නිකුත් කරන මාර්ගෝපදේශ ද කමිටුව අනුගමනය කළ යුතුය.

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය, පරිපාලන නිලධාරී, අභ්‍යන්තර විගණක සහ අනෙකුත් අවශ්‍ය නිලධාරීන් රැස්වීම් වලට සහභාගී වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරීවරයා නිරීක්ෂකයකු ලෙස කමිටුවට සහභාගී වේ.

## විගණන කමිටුවේ රැස්වීම් ගණන

විගණන කමිටුවේ රැස්වීම් මාසිකව පැවත්වූ අතර ඒවායේ පැමිණීම පහත පරිදි වේ.

| අධ්‍යක්ෂවරයා | සහභාගි වූ | සහභාගි නොවූ |
|---|---|---|
| රංජිත් තේනුවර මහතා | 11 | 1 |
| ඩී. එන් නානායක්කාර මහතා | 12 | 0 |
| ආර්. කේ ජයලත් මහතා | 12 | 0 |

# අවදානම් කළමනාකරණ වාර්තාව

### අවදානම් කළමනාකරණ ප්‍රවේශය

අවදානම් කළමනාකරණය සංවිධානයේ සෑම සේවකයකුගේම වගකීමක් වන අතර ආයතනය තුළ විධිමත් ව්‍යාපාර අවදානම් කළමනාකරණ ශ්‍රිතයක් (ERM) ක්‍රියාත්මක වේ. එම ව්‍යාපාර අවදානම් කළමනාකරණ ශ්‍රිතය මගින් අවදානම් කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩභාවය සහ අර්බුද කළමනාකරණය වැනි අංශ ආවරණය වේ. අන්තර්ජාතික ප්‍රමිත හා අවශ්‍යතා වලට ගැලපෙන සාංගමික අවදානම් කළමනාකරණ ශ්‍රිතයක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම ව්‍යාපාර අවදානම් කළමනාකරණ ශ්‍රිතයෙහි වගකීම වේ. අවදානම් කළමනාකරණ පද්ධතියෙහි ප්‍රතිඵල මණ්ඩලයේ විගණන හා කළමනාකරණ කමිටුව වෙත කාර්තු පදනමින් වාර්තා කරනු ලැබේ.

### අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය පදනම් වන්නේ ඉහත සඳහන් අන්තර්ජාතික ප්‍රමිත හා විෂය රාමුව මත හා පහත දර්ශනය හා මූලධර්ම මතය.

### අවදානම් කළමනාකරණ දර්ශනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සාර්ථකත්වය සඳහා එහි ව්‍යාපාර අරමුණු කරා හඹා යෑමේදී ඊට ගැලපෙන අවදානම් වලට මුහුණ දීමට සිදු වේ. ව්‍යාපාර අවදානම් කළමනාකරණ ශ්‍රිතය මගින් අවදානම් සැලකිය යුතු ලෙස හා වගකිව යුතු ලෙස කළමනාකරණය කළ බවට සහතික වීමට උපකාරී වන විනය හා ව්‍යුහය සපයනු ලැබේ. අවදානමට සම්බන්ධ දැනුවත් කිරීම සාංගමික සංස්කෘතියේ කොටසක් වන අතර අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම සේවකයින් සතුවේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ව්‍යාපාර පරිචයන් සඳහා අවදානම් කළමනාකරණය ඇතුළත් කිරීම තුළ වගකීම, සම්පූර්ණත්වය හා ගෞරවය යන සාංගමික වටිනාකම් සේවකයින්ගෙන් ප්‍රදර්ශනය වීම සහතික කිරීමට උපකාරී විය.

මෙම දර්ශනයට පහත සඳහන් අවදානම් කළමනාකරණ මූලධර්ම උපකාරී වේ.

- වටිනාකම් නිර්මාණය හා ආරක්ෂාව
- සියලුම සංවිධාන ක්‍රියාවලිවල අන්තර්ගත කොටසක් වන අතර තීරණ ගැනීමේ ද කොටසක් වේ.
- විවෘතව අවිනිශ්චිතභාවයන් ආමන්ත්‍රණය කරයි.
- විධිමත්, ව්‍යුහාත්මක හා කාලීන වේ.
- පවතින හොඳම තොරතුරු මත පදනම් වීම.
- තත්ත්වයන්ට ගැලපෙන ලෙස සකසා තිබීම.
- මානව හා සංස්කෘතික සාධක සැලකිල්ලට ගැනීම.
- විනිවිදභාවය හා අන්තර්ගතභාවය
- ක්‍රියාශීලී, පුනර්කාරී සහ වෙනස් වීම කෙරෙහි ප්‍රතිචාර දැක්වීම
- සංවිධානයේ අඛණ්ඩ වර්ධනයට පහසුකම් සැපයීම.

### හඳුනාගත් අවදානම් හා ඒවා කළමනාකරණය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය මුහුණ දෙනු ලබන ප්‍රධාන අවදානම් තත්ත්වයන්, අවදානම් කළමනාකරණයේ කොටසක් ලෙස හඳුනාගනු ලැබේ. එම අවදානම් සහ ඒවා අඩු කිරීමටත් ඇතැම් විශේෂ අවස්ථා වල ඒවා සමනය කිරීමටත් ගනු ලැබූ ක්‍රියාමාර්ග පහත පරිදිය.

| අවදානම | අවදානම විස්තර කිරීම | අවදානම් කළමනාකරණය |
|---|---|---|
| **උපායමාර්ගික අවදානම** | උපායමාර්ගික ඉලක්ක හා අරමුණු ළඟා කරගැනීම සඳහා සමාගමේ හැකියාවට බලපෑමක් වන, ඵලදායීව සම්පත් බෙදාහැරීමට බලපෑමක් කළ හැකි අවදානම්, සමාගමේ ඉලක්ක හා අරමුණු වලට සමගාමී නොවන මූලික ක්‍රියාමාර්ග ගැනීමේ හා ඒවා ඵලදායීව පවත්වා ගෙන නොයෑමේ අවදානම, ප්‍රධාන පාර්ශවයන් සමඟ පවතින සබඳතා වලට බලපෑම් කළ හැකි අවදානම් මෙන්ම ගරුත්වය, මනා පිළිගැනීම කෙරෙහි බලපෑම් කළ හැකි අවදානම් සහ බාහිර පරිසර සාධක උපායමාර්ගික අවදානම් යටතට ගැනේ. | වෙළඳපොල පර්යේෂණ සහ ප්‍රධාන නිෂ්පාදිත සහ ශ්‍රිතයන් සඳහා විධිමත් කළ උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලි.<br>රජයේ අයවැය තුළ විශේෂ ප්‍රසාදයට ලක්වූ ඉහත දැඩි වාර්ෂික ව්‍යාපාර සැලසුම් ක්‍රියාවලියකට කළමනාකරණය සම්බන්ධ වේ.<br>කළමනාකරණය විධිමත් ව්‍යාපෘති ක්‍රමෝපායන් ස්ථාපිත කර ඇති අතර එය ප්‍රධාන පාර්ශවකරුවන් අතර ඵලදායී සන්නිවේදනයක් සංවර්ධනය කිරීමට හා පවත්වා ගෙන යාමට බැඳී සිටී. |

# අවදානම් කළමනාකරණ වාර්තාව

| අවදානම | අවදානම විස්තර කිරීම | අවදානම් කළමනාකරණය |
|---|---|---|
| **ත්‍යාග මුදල් ගෙවීම් අවදානම** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉදිරිපත් කරන ලොතරැයි වල සෑම මට්ටමකටම ප්‍රමිතගත ත්‍යාග මුදල් ගෙවීම් අනුපාතයක් පවත්වා ගනී. මෙම ත්‍යාග මුදල් ගෙවීමේ අනුපාතය ඉහළ යාමේ සම්භාවිතාව මත අපගේ මුදල් ප්‍රවාහයට බලපෑම් කිරීමේ අවදානමක් පවතී. | මෙම අවදානම අවම කර ගැනීම සඳහා මුද්‍රණකරුවන් ගෙන් ලබාගත් රක්ෂණ ආවරණයක් ඇත. |
| **ආර්ථික අවදානම** | ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලන පරිසරය පාරිභෝගිකයින්ගේ මිලදී ගැනීමේ රටාවට බලපෑම් කරනු ලැබේ. | ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලන පරිසරයේ වෙනස් වීම් හඳුනා ගැනීමට පර්යේෂණ මත පදනම් වූ උපායමාර්ග සකස් කොට ඇත. |
| **මූල්‍ය අවදානම** | සමාගමේ තීරණ ගැනීමේ හැකියාවට බාධා කළ හැකි මුදල් ප්‍රවාහ හා මූල්‍ය තොරතුරු කාර්යක්ෂමව හා ඵලදායිව කළමනාකරණය නොවීමේ අවදානම් මූල්‍ය අවදානම් යටතට ගැනේ. | අවදානම් හඳුනාගෙන ඇති අතර ඒවා අවම කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| **ද්‍රවශීලතා අවදානම** | ඉතා ඉහළ වටිනාකමින් යුත් ත්‍යාග මුදල් ඉක්මනින් ජයග්‍රහණය කිරීම නිසා ද්‍රවශීලතා අවදානම් පැනනගී. | එවැනි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ඉතා ඉහළ ද්‍රවශීල වත්කම් පවත්වා ගන්නා බවට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහතික වේ. |
| **මෙහෙයුම් ආවදානම** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් කාර්යක්ෂම නොවීම, පරිභෝගිකයින්ගේ අවශ්‍යතා ඉෂ්ට නොවීම සහ සංවිධානයේ වැදගත් මූල්‍ය වත්කම් ආරක්ෂා නොවීමේ අවදානම් මෙහෙයුම් අවදානම් වලට ඇතුළත් වේ. එසේම මෙහෙයුම් අවදානම් තාක්ෂණය, මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික සිද්ධීන් නිසාවෙන්ද පැනනගී. වංචනික ව්‍යාජ ටිකට් පත්, සේවක වැරදි, පරිගණක පද්ධති දෝෂ හා බිඳවැටීම්, ගංවතුර, සුනාමි, නියඟ හා අඛණ්ඩ වැසි වැනි ස්වාභාවික විපත් වලින් බලපෑම් ඇතිකළ හැකිය. | එවැනි අවදානම් ආවරණය කිරීමට රාජකාරී පැවරීම, අභ්‍යන්තර පාලන, අභ්‍යන්තර පරීක්ෂා, නවීන පරිගණක පද්ධති සහ අභ්‍යන්තර විගණනය වැනි දෑ ස්ථාපනය කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් පාරිභෝගිකයින්ට නිෂ්පාදිත හා සේවා ඵලදායීව ලබාදීමට හා ප්‍රවර්ධනයට ගැලපෙන ක්‍රියාකාරී ක්ෂේත්‍ර ස්ථාපිත කිරීමත් පද්ධති සංවර්ධනය කිරීමත් සිදුකර ඇත. එහි ඉලක්ක හා අරමුණු ළඟා කරගැනීම සඳහා වර්තමාන හා අනාගත මෙහෙයුම් අවශ්‍යතා වලට ගැලපෙන සම්පත් බඳවා ගැනීම, සංවර්ධනය හා රඳවා ගැනීමත් තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කළමනාකරණය සමඟ එක්ව් එම උවදුරු කළමනාකරණය කරගැනීමත් සිදු කරයි. කළමනාකරණය නිරන්තරයෙන් මෙහෙයුම් ඒකක වල, මහා පරිමාණ ව්‍යාපෘති වල හා විශේෂිත ව්‍යාපාර ක්‍රියාවලි හා සම්බන්ධ අවදානම් සමාලෝචනය හා ඇගයීම සිදුකරන අතර අඛණ්ඩ වර්ධනය සඳහා උපකාරී වන ක්‍රියාමාර්ග සැලසුම් සංවර්ධනය කරයි. |
| **කීර්තිය පිළිබඳ අවදානම** | කීර්තිය පිළිබඳ අවදානම යනු සංවිධානය කෙරෙහි මහජන විශ්වාසය අහිමි වීමේ අවදානමයි. දෘශ්‍ය මාධ්‍ය මත දැඩි ලෙස රඳා පැවතීම, මහජන ඇල්ම සහ සමරු කලාප සඳහා සහාය පැතීම වැනි දෑ නිසා බොහොමයක් අවදානම් පවතී. | මේවා අප ඉතා සුපරික්ෂාකාරීව අධීක්ෂණය කරන අතර නිකුත් කිරීමට පෙර ප්‍රකාශ වල නිවැරදිභාවය හා ගුණාත්මකභාවය තහවුරු කරගෙන මාධ්‍ය නිෂ්පාදිත වලට අදාල සෑම ඉල්ලීමක්ම තෘප්තිමත් කිරීමට අප උත්සාහ ගනු ලබයි. |
| **නෛතික අවදානම** | අධිකරණ නීතිය තුළදී කලින් අපේක්ෂා නොකල ගනුදෙනු හා මණ්ඩලයට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග වලට සාර්ථකව මුහුණ දීමට නොහැකි වීම නිසා නෛතික අවදානම් ඇතිවේ. | නීති හා වෙනත් වෘත්තිකයින් වෙතින් අවශ්‍ය උපදෙස් ලබාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එවැනි තත්ත්වයන් අවම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන ඇත. |
| **තොරතුරු තාක්ෂණ අවදානම** | ප්‍රධාන පරිගණක පද්ධති වලින් ලබාදෙන නිවැරදි හා කාලීන තොරතුරු මත සංවර්ධන ලොතරැයි මණ්ඩලය යැපෙනු ලබයි. | තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නව්‍යකරණයට හා උසස් කිරීමටත් දැනට පවතින මෘදුකාංග යාවත්කාලීන කිරීමටත් සැලසුම් ආරම්භ කර ඇත. |

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා අපගේ වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන අප සතුටට පත් වෙමු.

### විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුවට පහත විධායක නොවන අධ්‍යක්ෂවරු ඇතුළත් වේ.

01. රංජිත් තේනුවර මහතා - සභාපති

02. ඩී. එන් නානායක්කාර මහතා - සාමාජික

03. ආර්.කේ. ජයලත් මහතා - සාමාජික

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය, පරිපාලන නිලධාරී, අභ්‍යන්තර විගණන සහ අනෙකුත් අවශ්‍ය නිලධාරීන් රැස්වීම් වලට සහභාගී වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරීවරයා නිරීක්ෂකයකු ලෙස කමිටුවට සහභාගී වේ.

### විගණන කමිටුවේ භූමිකාව

මණ්ඩලයේ වත්කම් සහ පාර්ශවකරුවන්ගේ ඇල්ම ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගැනීම කමිටුවේ ප්‍රමුඛතාවය හිමිවිය යුතු ක්ෂේත්‍රයකි. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයෙන් හා අනෙකුත් අදාල අධිකාරීන් විසින් නිකුත් කරන මාර්ගෝපදේශ ද කමිටුව අනුගමනය කළ යුතුය. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන කමිටුව විසින් එහි මූලික වගකීම් වලට අදාලව සිදුකළ කටයුතු වල සාරාංශයක් පහත දැකවේ.

1. මූල්‍ය වාර්තා නිකුත් කිරීමට ප්‍රථමව ඒවායේ අන්තර්ගත වැදගත් මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් සමාලෝචනය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වල සම්පූර්ණත්වය හා අනුකූලතාවය නිරීක්ෂණය කිරීම. එයට ගිණුම්කරණ ප්‍රතිපත්ති, සටහන් හා පරිචයන්, ප්‍රධාන විනිශ්ච ක්ෂේත්‍රයන් සහ නෛතික හා නියාමන අවශ්‍යතා වල අනුකූලතාවය පිළිබඳ සමාලෝචනය අයත් වේ. මූල්‍ය ප්‍රකාශන විගණනයේ සොයාගැනීම් සමාලෝචනයේ කොටසක් ලෙසට එම කරුණුද විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ විගණන කමිටු සාකච්ඡා කරන ලදී.

2. අභ්‍යන්තර විගණකවරයා විසින් අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුව පවත්වා ගෙන ගිය කලින් කලට සිදු කළ අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කරන ලදී. අභ්‍යන්තර විගණන වාර්තා මඟින් පද්ධති හා ක්‍රමවේද වල ඇති අඩුපාඩු පෙන්වා දී ඇති අතර කළමනාකරණය සමග එකඟ වූ පසු අවශ්‍යතාවය මත පවතින ක්‍රියා පද්ධති හා ක්‍රමවේද උසස් කිරීමට අවශ්‍ය නිර්දේශ කිරීම් සිදුකර ඇත. අභ්‍යන්තර විගණන මගින් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සොයා බලන අතර ප්‍රගතිය කළමනාකරණයට හා විගණන කමිටුවට වාර්තා කරනු ලැබේ. කාලච්ඡේදය තුළ සිදුකළ සෑම විගණනයකම මූලික සොයා ගැනීම් වල සාරාංශ ඇතුළත් වාර්තා නිතිපතා අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන කමිටුවට ලබා දේ. කළමනාකරණ උපදෙස් ද එහි අන්තර්ගත කරන අතර කමිටුව විසින් එම විගණන නිරීක්ෂණයන්ට මුල්වූ හේතු සොයා බලා ඒවා නැවත සිදු නොවන ආකාරයට ක්‍රියාමාර්ග ගනු ලැබේ.

3. අභ්‍යන්තර විගණනයේ හා රජයේ විගණන වල උපකාරය ඇතිව වියදම් සඳහා බලාත්මක සීමාවන්, ආදායම් ක්‍රියාවලිය හා ප්‍රාග්ධන වියදම්, අත්සන් තැබීමේ අධිකාරිය, තොරතුරු තාක්ෂණ පද්ධති පාලනයන්, සංවිධාන ව්‍යුහය, ප්‍රතිපත්ති, රාජකාරි බෙදාවෙන් කිරීම් සහ කළමනාකරණයේ සමාලෝචනයන් ඇතුළු මණ්ඩලයේ මෙහෙයුම් හා මූල්‍ය පාලනයන් සහ ක්‍රමවේද වල ඵලදායීතාවය තක්සේරු කිරීමක් කමිටුව සිදුකරයි. මණ්ඩලයේ ශේෂ පත්‍රයේ ද්‍රවශීලතා තත්ත්වය නිතිපතා නිරීක්ෂණය කරනු ලැබේ. මේවායින් හඳුනාගන්නා අඩුපාඩු සහ ඒවාට විසඳුම් නිර්දේශ ද අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබේ. පොදු ව්‍යාපාර කාරක සභාව මණ්ඩලයට නිකුත් කරන නියෝග පිළිබඳව කමිටුව විශේෂ අවධානයක් යොමු කරයි.

### විගණන කමිටුවේ රැස්වීම් ගණන

මාසිකව රැස්වීම් 12 ක් පැවත්වූ අතර ඒවායේ පැමිණීම පහත පරිදි වේ.

| අධ්‍යක්ෂවරයා | සහභාගි වූ | සහභාගි නොවූ |
|---|---|---|
| රංජිත් තේනුවර මහතා | 11/12 | 01 |
| ඩී. එන්. නානායක්කාර මහතා | 12/12 | Nil |
| ආර්. කේ. ජයලත් මහතා | 12/12 | Nil |

විගණන කමිටුව වෙනුවෙන්

සභාපති

විගණන හා කළමනාකරණ කමිටුව


09
01
08
F
මූල්‍ය වාර්තා

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එෆ්ආර්2/ඒ/ඩීඑල්බී/1/14/1

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 සැප්තැම්බර් 3 දින,

සභාපති,

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී)වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 14(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2015 ජූලි 14 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දක්වන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරීක්ෂණ ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරීක්ෂණ, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01

(i) මණ්ඩලයේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත ලොතරැයි පත් අලෙවිය වූ අතර ඒ සඳහා යොදනු ලබන වාහන හේතුවෙන් වන වියදම් සහ ක්ෂය වීම එකතුව රු.19,463,884ක්

පරිපාලන වියදම් ලෙස සැලකීම හේතුවෙන් වියදම් වර්ගීකරණය නිවැරදිව නිරූපනය නොවිය.

**(ii)** ජාතිය ගොඩනැගීමේ බදු මුදල වූ රු. 198,540,485 ක් විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දැක්විය යුතු වුවත් මණ්ඩලය විසින් එම බදු මුදල විකුණුම් ආදායමින් අඩුකර දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36

මණ්ඩලයේ අපේක්ෂිත ආර්ථික අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකරන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වටිනාකම රු. 30,013,677 ක්වූ විශ්‍රාමාගාරය සම්බන්ධයෙන් හානිකරනා පරීක්ෂාවක් (Impairment Test) සිදුකර එක්කමේ ධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිනුම් වාරයන් සඳහා වෙන්කළ එහෙත් ජයග්‍රාහකයින්ට හිමිනොවූ රු.100,168,320 ක ත්‍යාග මුදලක් සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේදී ත්‍යාග සංචිත ගිණුමට මාරුකළ යුතු වුවත්, එසේ කිරීමෙන් තොරව ලෙජර ගිණුම් තුලින් ගලපා තිබුණ හෙයින් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ ගණනය කිරීම් අනුව 2001 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මණ්ඩලය විසින් ගෙවීම පැහැර හැර ඇති ආදායම් බදු වටිනාකම රු.3,320,913,232 ක් විය. මණ්ඩලය විසින් එම කාලසීමාවට අදාල ආදායම් බදු ලෙස රු.284,896,813 ක නක්සේරු වාර්තාවක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත්කර තිබුණද ඒ සඳහා 2015 මාර්තු 17 දිනටත් එකඟතාවය ලැබී නොතිබුණි. එහෙත් මණ්ඩලය මෙම තත්ත්වය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් ඇණවුම් කර 2008 වර්ෂයේදී මණ්ඩලය නමින් ලියාපදිංචි කර තිබුණ රු.8,095,000 ක් වටිනා ඩබල්කැබ් රථයක් හිටපු සභාපතිවරයා විසින් සැපයුම්කාර සමාගමෙන් භාර ගෙන තිබුණ අතර එම ඩබල්කැබ් රථය සමාලෝචිත වර්ෂයේ අවසාන දිනය වන විට ද මණ්ඩලය වෙත භාර දී නොතිබුණි. විගණනයේදී භෞතික පැවැත්ම තහවුරු නොවූ එම රථයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ තුල අන්තර්ගත කර අදාල වටිනාකම පුද්ගලික ආයතනයකට ගෙවිය යුතු බැරකමක් ලෙස නිරූපනය කර තිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලී පදනමට ලබා ගැනීම සඳහා 2003 නොවැම්බර් 01 දින මණ්ඩලය විසින් [illegible] අමාත්‍යාංශය වෙත රු.8,685,360 ක කුලී අත්තිකාරමක් ගෙවා තිබුණි. පසුව මණ්ඩලය එම ගොඩනැගිල්ල කුලී පදනමට ලබා නොගැනීමට තීරණය කර තිබීම නිසා කුලී අත්තිකාරම් ලෙස ගෙවූ මුදලින් රු.2,985,360 ක් පමණක් මණ්ඩලයට ආපසු ලැබී තිබුණු අතර තවදුරටත් අය විය යුතු රු.5,700,000 ක් මෙතෙක් අය වී නොතිබුණි. මෙම මුදල අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එන විටත් අධිකරණ ක්‍රියාමාර්ග නිම වී නොමැති බාහිර පුද්ගලයෙකුගෙන් අය විය යුතු රු.2,520,000 ක ලැබිය යුතු ශේෂයක් විය.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත | |
| (i) 18(3) වගන්තිය | ත්‍යාග සංචිත ගිණුමේ ශේෂය අලුතින් ලොතරැයියක් හඳුන්වාදීමේදී හා දිනුම් ලබාදීම සඳහා මුදල් ප්‍රමාණවත් නොවන විට පමණක් උපයෝජනය කළ හැකි වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ත්‍යාග සංචිත ගිණුමේ පවත්නා රු.874,670,557 ක් වූ ශේෂයෙන් රු.405,000,000 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි මණ්ඩලයේ කාර්යාලය පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල අත්පත්කර ගැනීම සඳහා උපයෝජනය කර තිබුණි. ඒ අනුව, පනතේ විධිවිධාන ප්‍රකාරව උපයෝජනය සඳහා රු.469,670,557 ක මුදලක් පමණක් ත්‍යාග සංචිත ගිණුමට අදාලව මණ්ඩලය සතුව තිබුණි. |
| (ii) 19 (1), (2) සහ (3) වගන්ති | වගන්ති ප්‍රකාරව ලොතරැයි සම්බන්ධයෙන් රීති පනවා කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් තොරව ඒ ඒ අවස්ථාවලදී |

ලබාගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව අතුරු වර්ෂවලදී එමෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් පූරණ ලොතරැයි හා දිනුම් ඇදීමෙන් ජයග්‍රාහකයින් නොවූ සන්නා ලොතරැයි පත්‍රවල රු.9,728,586,929 ක අලෙවි ආදායමක් උපයාගෙන තිබුණු අතර එම වටිනාකමින් රු.6,211,302,790 ක් ත්‍යාග සඳහා වෙන් කිරීමක් රු.2,063,639,652 ක් අලෙවි නියෝජිත කොමිස් ලබාදීමක් මණ්ඩලය විසින් සිදුකර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xxiv පරිච්ඡේදයේ 11.5.1 වගන්තිය

වගන්තියට අනුකූලවීමෙන් තොරව සේවක දේපල ණය පොලියෙන් සියයට 50 ක් මණ්ඩලය විසින් දැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණ කර තිබුණු අතර, ඒ අනුව ගණනය කර නිලධාරීන්ගේ දේපල ණය පොලී ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.5,836,164 ක් ගෙවා තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 6.5.1 වගන්තිය

සමාලෝචිත වර්ෂයට අදාළ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 8.3.5 (ආ) වගන්තිය

වගන්තිය ප්‍රකාරව ප්‍රතිපාදන නොමැති මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරීවරු 05 දෙනෙකු සඳහා නිල වාහන අනුයුක්ත කර රු.1,248,390 ක ඉන්ධන වියදම සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිපූර්ණය කර තිබුණි.

(iii) 9.7 හා 9.12 වගන්ති

භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මත මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සේවකයන් වෙනුවෙන් රු.25,141,298 ක වෛද්‍යාධාර ගෙවා තිබුණු අතර, එම වටිනාකම තුළ තිබිය වෛද්‍ය බිල්පත් ලබාගැනීමෙන් තොරව මුදලින් ගෙවා තිබූ වටිනාකම රු.9,225,519 ක් විය.

(ඈ) 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී-57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 , 6 (iii) හා 6 (iv) වන වගන්ති

මණ්ඩලය සමාලෝචිත වර්ෂයේ අලෙවි ප්‍රචාරණය වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනය මගින් රු.434,846,000 ක් අනුමත කර අලෙවි ප්‍රචාරණය සඳහා රු.306,981,876 ක් වැයකර තිබුණි. එහෙත් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ප්‍රචාරණ වැඩසටහන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර රජයට පරිබාහිර සමාගමයන් වෙත

ලබාදෙන රු.100,000 ඉක්මවූ අනුග්‍රහයන් සඳහා සහ නිකුත් කාර්යයන් වෙත ලබාදෙන රු.මිලියන 02 ඉක්මවූ අනුග්‍රහයන් සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,353,246,339 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,126,438,341 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.226,807,998 ක හෙවත් සියයට 10.6 ක වර්ධනයක් විය. ලොතරැයි ආදායම, දිනුම් ඇදීමේ වියදම, පරිපාලන වියදම, මූල්‍ය වියදම හා ආදායම් බදු යන අයිතමයන්හි අහිතකර විචලනය රු.246,758,679 ක් වූවද විකුණුම් පිරිවැය, ත්‍යාග සඳහා වෙන් කිරීම, වෙනත් ආදායම, වෙළඳ ප්‍රවර්ධන වියදම හා ත්‍යාග ආපසු පවරා ගැනීම යන අයිතමයන්ගේ හිතකර විචලනය රු.473,566,677 ක් වීම මෙම වර්ධනයට බලපා තිබුණි.

### 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.212,788,222 කින් හෙවත් සියයට 2.1 කින් අඩුවී තිබුණද විකුණුම් පිරිවැය රු.284,492,622 කින් හෙවත් සියයට 3.9 කින් පහළයාම දළලාභ අනුපාතය සියයට 28 සිට සියයට 29 දක්වා ඉහළයාම කෙරෙහි බලපා තිබුණි.

(ආ) වෙනත් ආදායම රු.8,188,886 කින් හා නොදිනූ ත්‍යාග ආපසු පවරා ගැනීම රු.62,004,480 කින් ඉහළයාමත් ලොතරැයි වෙළඳප්‍රවර්ධන වියදම රු.93,853,621 කින් පහළයාමත් ශුද්ධ ලාභය සියයට 21 සිට සියයට 24 දක්වා වර්ධනය වීමට හේතුවී තිබුණි.

(ඇ) මණ්ඩලයේ ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් පවතින අතර ජංගම හා ක්ෂණික අනුපාත ප්‍රශස්ත මට්ටමක නොපැවතුණි. සමාලෝචිත වර්ෂයේදී කාරක ප්‍රාග්ධන කළමනාකරණය සම්බන්ධයෙන් මණ්ඩලයේ අවධානය යොමුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.22,950,330 ක පාරිතෝෂික සංචිතයෙන් රු.12,274,776 ක් මණ්ඩලයේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම තුළින් ඒ බව තවදුරටත් තහවුරු විය

**3.3 මණ්ඩලයට එරෙහිව හෝ මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

මෝටර් රථයක් මිලදී ගැනීමකට අදාලව පුද්ගලික සමාගමක් විසින් රු.8,095,000 ක වන්දි ඉල්ලා මණ්ඩලයට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොණු කර තිබුණ අතර රු.2,520,000 ක ගොඩනැගිලි කුලී මුදලක් අයකර ගැනීම අරමුණුවෙන් මණ්ඩලය විසින් තවත් පුද්ගලයෙකුට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොණු කර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මණ්ඩලය විසින් ගෙවිය යුතු වට් දක්වා ඇති රු.මිලියන 3,540 කට අධික හිඟ ආදායම් බදු, ආර්ථික සේවා ගාස්තු හා එකතු කළ අගය මත බදු ආදිය පිළිබඳ ගැටළුව නිරාකරණය කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණ අතර එම ගැටළුව වන සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 28 සිට සැප්තැම්බර් 5 දක්වා මණ්ඩලයේ සියළුම බැංකු ගිණුම් තාවකාලිකව අත්හිටුවීමට ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. මෙම හිඟ බදු ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා රු.4,825,000 ක කොන්ත්‍රාත් ගාස්තුවක් යටතේ බදු උපදේශකයෙකුගේ සේවය ලබාගැනීමට මණ්ඩලය තීරණය කර සමාලෝචිත වර්ෂයේදී බදු උපදේශකට රු.2,485,000 ක් ගෙවා තිබුණි. බදු උපදේශකගේ තක්සේරුව නිර්ණය අනුව මණ්ඩලය විසින් හිඟ ආදායම් බදු ලෙස රු.284,896,813 ක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවා තිබුණද ගැටළුව නිරාකරණය වී නොතිබුණ අතර දඩ මුදල් ඉවත් කිරීමෙන් පසු රු. මිලියන 1,807 ක් වූ ඉතිරි හිඟ බදු මුදල් සමාන වාරික 83 කින් ගෙවීමට 2015 වර්ෂයේදී මණ්ඩලය එකඟ වී තිබුණි.

(ආ) 2009 නොවැම්බර් 17 දිනැති අංක ඩීඑම්එස්/01/04/4/015 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ ලිපිය ප්‍රකාරව අභ්‍යන්තර උපදේශක තනතුර දරන්නාට පමණක් සීමාවන පරිදි අනුමත කර තිබුණ අතර එම නිලධාරියා සේවයෙන් ඉවත්වීමත් සමග එම තනතුර අහෝසි විය යුතු වුවත් ඊට පටහැනිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් නොමැතිව 2013 ජූලි 01 දින අභ්‍යන්තර උපදේශක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. එම නිලධාරියාට 2013 ජූලි මස 01 දින සිට 2015 පෙබරවාරි 28 දින දක්වා රු.1,710,000ක දීමනාවක් ගෙවා තිබුණද එම තනතුර ඇති කිරීමෙන් මණ්ඩලය බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) ජාතික ලොතරැයියක් මුද්‍රණය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමග එළඹ ඇති ගිවිසුම ප්‍රකාරව අදාළ ගුණාත්මකභාවයෙන් හා නිරවද්‍යතාවයෙන් යුක්ත ටිකට්පත් ලැබිය යුතු වුවත්

කොන්ත්‍රාත්කරු විසින් ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද ඒ අනුව කටයුතු කර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේදීද රු.3,135,000 ක් වටිනා ටිකට්පත් 3,000,000 ක් සිරීමට නොහැකිව තිබුණ නමුත් මණ්ඩලය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4.(අ) සහ(ආ) ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ක්ෂණික ලොතරැයි අලෙවි ආදායම රු.153,204,680 කින් එනම් සියයට 37 කින් පහළගොස් තිබුණි. අදාළ නියෝජිතයන්ගේ ඇණවුම්වලට අනුව නියමිත ප්‍රමාණවලින් ප්‍රශ්ණ ටිකට්පත් නොමැතිවීම මෙම තත්ත්වයට හේතුවී තිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී මණ්ඩලය විසින් සකස්කරන දිනුම් අදින ලබන සුපර් බෝල් (Super Ball) ලොතරැයි ටිකට්පත් අලෙවියෙන් සියයට 40 ක් පමණ පදනම් අලෙවිකර තිබුණ අතර සමාලෝචිත වර්ෂය තුළදී එසේ ණයට විකුණන ලද ටිකට්පත් වල වටිනාකම රු.951,792,000 ක් විය. මෙම ණයට විකුණුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හෝ ප්‍රධානියාගේ ලබාගැනීම හෝ සිදුකර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අත්පොත්වලයේ වාර්ෂික යටතේ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර එහි නිර්දේශ ලබාගැනීමකින් තොරව අදාළ ප්‍රචාරක කටයුතු සඳහා මිලදී ගැනීමට මණ්ඩලය විසින් අවස්ථා 13 කදී එකතුව රු.5,332,700 ක් වූ ද රු.3,205,200 ක් වටිනා ටී ෂර්ට් 6107 ක් හා රු.2,127,500 ක් වටිනා හිස් වැසුම් 17,000 ක් මිලදී ගෙන තිබුණි. 2014 වර්ෂයේ ටී ෂර්ට් සහ හිස් වැසුම් අවශ්‍යතාවය පූර්ව නිශ්චය කර එකවර මිලදී ගැනීමෙන සිදු කලේ නම් එමගින් ලබා ගත හැකිව තිබූ ප්‍රමාණාත්මක වාසිද මෙම අවස්ථාවේ මිලදී ගැනීම තුළින් මණ්ඩලයට අහිමිවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දිනුම් ඇදීම සඳහා මුද්‍රණය කරන ලද රු.346,407,503 ක් පිරිවැය වූ ටිකට්පත් 706,891,400 ක් අතරින් අදාළ නොවූ ටිකට්පත් 68,748,179 ක් වූ අතර එහි පිරිවැය රු.33,689,595 ක් විය. එය මුළු ටිකට්පත් පිරිවැයෙන් සියයට 9.7 ක් විය.

## 4.3 [illegible] ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් තෝරාගැනීමේ ක්‍රමවේදයකින් හා දෙපාර්තමේන්තුව අතර ගිවිසුමකට එළඹීමකින් තොරව පෞද්ගලික වෙබ් අඩවියකට මණ්ඩලයේ වෙළෙඳ නාම සහ නිල ලාංඡනය (Trade name and Logo) ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,200,000 ක් ගෙවා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වැය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු.36,807,205 ක් ලබාදී තිබුණ අතර ඒවා අලෙවි හා බෙදාහැරීම් වියදම් යටතේ දක්වා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව ආයතන 03 කින් මිල ගණන් කැඳවා මණ්ඩලයේ ප්‍රචාරක කමිටුව තෝරාගත් ආයතනයක් විසින් සකස්කළ විනාඩි 5 ක වාර්තා වැඩසටහන් රාජ්‍ය විද්‍යුත් මාධ්‍යයක් හරහා විකාශනය කර තිබුණ අතර ඒ සඳහා 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.13,958,000 ක් හා රු.16,540,000 ක් බැගින් එකතුව රු.30,498,000 ක් ගෙවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයාගේ භාවිතය සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් තොරව අවස්ථා දෙකකදී කුලී පදනම මත මෝටර් රථ සපයාගෙන 2014 ජනවාරි සිට ජූලි දක්වාත් සහ නොවැම්බර් සිට දෙසැම්බර් මාසය දක්වාත් රු.1,111,060 ක මුදලක් කුලිය ලෙස ගෙවා තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ කිසිදු මාර්ගෝපදේශයක් අනුගමනය කිරීමෙන් තොරව ප්‍රචාරණ ආයතනයක ඉල්ලීම පරිදි මණ්ඩලයේ ප්‍රචාරණ කමිටු නිර්දේශය අනුව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ අභ්‍යන්තර හා බාහිර පරිශ්‍රයේ 2014 ජූනි මස 01 දින සිට වසරක කාලසීමාවක් තුල ඩිජිටල් දැන්වීම් පුවරු යොදාගෙන ලොතරැයිපත්වලට අදාල ප්‍රචාරණ කටයුත්තක් සිදුකිරීම සඳහා මණ්ඩලය විසින් රු. 23,986,561 ක්වූ මුළු මුදලම සැපයුම්කරුට එකවර ගෙවා තිබුණි. ගිවිසුම්ගත පරිදි දැන්වීම් ප්‍රචාරණය වන බව තහවුරු කරගැනීම සඳහා විද්‍යුත් යාන්ත්‍රික ක්‍රමවේදයක් ප්‍රචාරණ ආයතනය විසින් හඳුන්වාදී නොතිබුණ අතර තෙවන පාර්ශවයක් විසින් සහතික කළ විකාශන සනොයක්ෂණ වාර්තාවක් (Transmition Report) ගෙන්වා ගෙන ප්‍රචාරණය නියි පරිදි සිදුවන බව සහතික කර ගැනීමට ද මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 ඡේදය ප්‍රකාරව මුල් කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ දින සිට මාස 06 ක කාලයක් ඉක්ම නොමැති නම් පමණක් නැවත වරක් එම රජයේ සැපයුම්කරුගෙන් අදාල භාණ්ඩ සපයා ගැනීමට හැකියාව ඇති නමුත් මුල් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර මාස හයක් ඉක්මවාගොස් තිබියදීත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව මිල ගණන් කැඳවීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු.1,488,642 ක් වටිනා පාපැදි 138 ක් සහ රු.333,380 ක් වටිනා රෝද පුටු 11 ක් පෙර කොන්ත්‍රාත්කරුගෙන්ම මිලදී ගෙන තිබුණි.

(උ) අලෙවි ප්‍රවර්ධන වියදම් යටතේ අනුග්‍රාහකත්වයන් ලබාදීමේදී අයිතම තෝරා ගැනීම හා තෝරාගත් අයිතමය සඳහා ගෙවන මුදල නිරණය කිරීමේදී අනුග්‍රාහකත්වය තුලින් මණ්ඩලයට ලැබෙන ප්‍රතිලාභ ඇගයීමේ ක්‍රියා පටිපාටියක් මණ්ඩලය විසින් හඳුන්වා දී නොතිබුණි. නියදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි සමාලෝචිත වර්ෂයේ එසේ විධිමත් ඇගයීමකින් තොරව අනුග්‍රාහකත්ව 07 වෙනුවෙන් එකතුව රු.24,427,000 ක් වැයකර තිබුණ අතර ඒවා

රු.2,000,000 ත් රු.5,355,000 ත් අතර පරාසයක විය. තවද, අනුග්‍රාහකත්වයන් සඳහා දරන ලද රු.9,331,800 ක වියදම් ලොතරැයි ප්‍රවාරණ නිෂ්පාදන ගාස්තු ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඖ) මණ්ඩලයේ ලොතරැයි දිනුම් ඇදීමේ පරිසනක පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ සේවාව ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව 2009 වර්ෂයේදී සැපයුම්කරුවකු තෝරාගෙන 2009 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා රු.71,348,976 ක් ගෙවා තිබුණි. මණ්ඩලයට ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා මණ්ඩලය විසින් විධිමත් බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත උපදේශකයෙකු බඳවාගෙන 2012 දෙසැම්බර් සිට 2015 පෙබරවාරි 28 දක්වා රු.2,055,000 ක දීමනා ගෙවා තිබුණද ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරගැනීමට හෝ ලොතරැයි දිනුම් ඇදීමේ පරිසනක පද්ධතිය නිර්මාණය කර ගැනීමට 2015 මැයි 31 දිනටත් මණ්ඩලය අපොහොසත්වී තිබුණි.

(ඇ) මණ්ඩලය සතු ජීප් රථයක් එවකට සිටි සභාපතිවරයාගේ උපදෙස් පරිදි 2012 පෙබරවාරි මාසයේ සිට 2014 නොවැම්බර් මාසය දක්වා දේශපාලන උත්සව හා රැස්වීම් කටයුතු සඳහා මණ්ඩලයට පරිබාහිර පුද්ගලයන් සමඟ ධාවනය කරවූ බවත් අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ධාවනයේ යෙදවූ බවට ධාවන සටහන් ලියා සභාපතිවරයාගේ උපදෙස් පරිදි මණ්ඩලයේ රහස්‍ය ලේකම් හා තවත් නිලධාරීන් දෙදෙනෙකු මඟින් ධාවන සටහන් අත්සන් කරවාගත් බවත් ජීප් රථය ධාවනය කළ රියදුරු විසින් විගණනයට ලිඛිතව ප්‍රකාශ කරන ලදි. තවද ඉහත සඳහන් පරිදි කොළඹින් පිටත ධාවන කටයුතු සිදු කළ අවස්ථාවලදී තම යැපීම් දීමනා ලබා ගැනීම සඳහා අලෙවි ප්‍රවර්ධන රාජකාරී සඳහා සහභාගී වූ බවට රියදුරු විසින් සාවද්‍ය තොරතුරු ඇතුළත් ලිපි ඉදිරිපත් කර තිබුණ අතර මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) විසින් එම ලිපි නිර්දේශකර රියදුරුට රු.249,750 ක දීමනා ලබා ගැනීම සඳහා කටයුතු කර දී තිබුණි.ඒ අනුව, ඉහත කාලසීමාව තුලදී මණ්ඩලයට පරිබාහිර අවශ්‍යතා වෙනුවෙන් ජීප් රථය ධාවනය කර රියදුරු වැටුප්, දීමනා හා ඉන්ධන වෙනුවෙන් මණ්ඩලය විසින් රු.3,170,017 ක් වැය කර තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් 2010 වර්ෂයේදී රු.38,752,448 ක් වැය කර ලොතරැයි දිනුම් ඇදීම් රූගත කිරීම සඳහා චිත්‍රාගාරයක් ඉදිකර තිබුණද එම චිත්‍රාගාරය ලොතරැයි දිනුම් ඇදීම රූගත කිරීම් කටයුතු සඳහා යොදාගෙන නොතිබුණ අතර චිත්‍රාගාරයේ පවතින අඩුපාඩු සම්බන්ධයෙන් අධ්‍යනය කර රූපවාහිනී සංස්ථාව මඟින් 2012 ජූනි මාසයේදී ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමටද මණ්ඩලය කටයුතු කර නොතිබුණි. මණ්ඩලය සතු චිත්‍රාගාරය භාවිතා නොකර ලොතරැයි දිනුම් ඇදීම ජාතික රූපවාහිනී සංස්ථාවේදී රූගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.35,800,000 ක් ගෙවා තිබුණි.

(ආ) වර්ෂ 4 ත් 10 ත් අතර කාලයක සිට නිකුත් නොකර පවතින ප්‍රවර්ධන භාණ්ඩ වර්ග 14 කට අදාළ රු.1,801,310 ක භාණ්ඩ ඒකක 616 ක් සම්බන්ධව නිශ්කාර්යව පැවතුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසය තුළදී මණ්ඩලය විසින් රු.20,850,000 ක් (බදු රහිත මිල) වැය කර ලොතරැයියන් 06 කට අදාළව පෝස්ටර් 600,000 ක් හා බැනර් 3,000 ක් යොදාගෙන ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව මණ්ඩලයේ අදාළ අංශය විසින් ලිපි ලේඛන අනුව තහවුරු කළද මණ්ඩලයේ ආරක්ෂක අංශයේ වාර්තා හා ප්‍රකාශ අනුව සහ මණ්ඩලයේ සබඳතා භාරකරු හා සබඳතා සහායකගේ ප්‍රකාශ අනුව පෝස්ටර් 60,000 ක් හා බැනර් 60 ක් පමණක් සබඳතාවට ලැබුණු බව ලිඛිත ප්‍රකාශ අනුව විගණනයට තහවුරු විය. ඒ අනුව විගණනයේ මණ්ඩලයට ලැබී තිබුණු පෝස්ටර් 60,000 ක් හා බැනර් 60 ක් සඳහා පිළිවෙලින් රු.1,260,000 ක් හා රු.165,000 ක් වශයෙන් එකතුව රු.1,425,000 ක් පමණක් ප්‍රවර්ධන ආයතන 03 ට ගෙවිය යුතු වුවත් , පෝස්ටර් 600,000 ක් හා බැනර් 3,000 ක් මණ්ඩලයට ලැබී ඒ තුළින් ප්‍රවර්ධන කටයුත්ත නිසි පරිදි සිදු වූ බව අදාළ අංශ මගින් ඉදිරිපත්කළ ලිපි ලේඛන පදනම් කරගෙන මණ්ඩලය විසින් රු.20,850,000 ක් ගෙවා තිබුණු හෙයින් මණ්ඩලයට රු. 19,425,000 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

**4.6 ආර්ථික නොවූ ගණුදෙනු**

මණ්ඩලය විසින් පුද්ගලික ආයතනයකට රු.1,295,000 ක් ගෙවා උපදේශන සේවා ලබාගෙන ISO 9001: 2008 ට අනුකූලතාවය දක්වන ගුණාත්මක කළමනාකරණ පද්ධතියක් (certificate of quality management system) සඳහා වන සහතික පත්‍රයක් සමාලෝචිත වර්ෂයේ දී ලබාගෙන තිබුණ ද මණ්ඩලයේ නිලධාරීන් තම කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීමේදී ගුණාත්මක අත් පොත (quality manual) සහ ගුණාත්මක පරිපාටීන් (quality procedures) අනුගමනය නොකරන බැවින් එමගින් ආර්ථික නොවූ ගණුදෙනුවක් බව විගණනයට නිරීක්ෂණය විය.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්යය මණ්ඩලය 201 ක් වුවද, සත්‍ය කාර්යය මණ්ඩලය 225 ක් විය. 2014 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 15 ක් පැවති අතර අතිරික්ත සංඛ්‍යාව 39 ක් විය.

(ආ) 2009 නොවැම්බර් 17 දිනැති අංක පීඊමර්ස්/3/04/4/015 දරන කළමනාකරන සේවා දෙපාර්තමේන්තු ලිපිය හා 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සේවකයන් 12 දෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි.

## 4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය සතු සම්පත් (මානව සම්පත්ද ඇතුළුව) විෂය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතනයක උපයෝජනය සඳහා යෙදවිය යුතු නොවුවත් ඊට පටහැනිව කණිෂ්ඨ ආරක්ෂක නිලධාරියෙකු 2010 අගෝස්තු 13 සිට මාතර ආයතනයකට මුදාහැර තිබුණි. අදාල කාලපරිච්ඡේදය තුල මණ්ඩලයට කිසිදු සේවයක් ලබාගැනීමකින් තොරව එම නිලධාරියා හට 2010 අගෝස්තු සිට 2014 දෙසැම්බර් දක්වා වැටුප් හා දීමනාව ලෙස රු.2,228,435 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මණ්ඩලය සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර මාසිකව රු.70,000 ක ගාස්තුවක් ගෙවමින් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වා පෞද්ගලික විගණන සමාගමක සේවය ලබා ගැනීමට මණ්ඩලය කටයුතු කර තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්තිත්වය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද ඒ තුළින් සියලුම ප්‍රසම්පාදනයන් ආවරණය කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

වියදම් විෂයයන් 07 ක හා වෙනත් ආදායම් විෂයයේ අයවැයගත හා සත්‍ය අගයන් අතර සියයට 6 ත් සියයට 209 ත් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මානව සම්පත් පරිපාලනය
(ඇ) වත්කම් පාලනය
(ඈ) වියදම් කළමනාකරණය
(ඉ) ගබඩා පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| **ආදායම** | 01 | **9,728,586,929** | 9,941,375,151 |
| ටිකට්පත් සඳහා පිරිවැය | 02 | **378,157,596** | 410,016,327 |
| ත්‍යාග මුදල් ගෙවීම් | 03 | **6,211,302,790** | 6,481,076,862 |
| දිනුම් ඇදීම් පිරිවැය | 04 | **272,501,090** | 255,360,909 |
| **දළ ලාභය** | | **2,866,625,453** | 2,794,921,054 |
| වෙනත් ආදායම් | 05 | **150,665,457** | 143,513,256 |
| බෙදාහැරීම් පිරිවැය | 06 | **524,797,737** | 627,574,930 |
| පරිපාලන වියදම් | 07 | **347,408,024** | 330,967,135 |
| මූල්‍ය පිරිවැය | 08 | **647,572** | 561,787 |
| **මෙහෙයුම් වියදම් වලට පසු අතිරික්තය** | | **2,144,437,576** | 1,979,330,457 |
| ත්‍යාග ලියා හැරීම් | | **277,785,380** | 215,780,900 |
| **බදු පෙර ලාභය** | | **2,422,222,956** | 2,195,111,357 |
| ආදායම් බදු | | **68,976,618** | 68,673,016 |
